# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2196/56 - 2020 ඔක්තෝබර් මස 09 වැනි සිකුරාදා - 2020.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/02/2017/147

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.08.02 දිනැති හා අංක 2082/54 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.07.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් පානදුර, ගාලු පාර, අංක 608/1 හි පදිංචි, ටී. නෙල්සන් ඒ. ප්‍රනාන්දු මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.08.12 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 02 වන දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/COM/02/2017/147

### කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

ටී. නෙල්සන් ඒ. ප්‍රනාන්දු
අංක 608/1, ගාලු පාර,
පානදුර.

නඩු අංකය : A/52/2018

*පළමු පාර්ශවය*

එදිරිව

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200, කිරුල පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශවය*

කම්කරු හා වෘත්තීය සම්බන්ධතා අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී, ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2018.02.24 දින දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට තුඩු දුන් කාරණය :-**

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ඒ. විමලවීර මහතා විසින් 2018 ජූලි මස 16 වන දිනැතිව එවා ඇති ලිපියේ දක්වෙන්නේ,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කළුතර ප්‍රාදේශිකයේ V ශ්‍රේණියේ නිලධාරි (උසාවි කටයුතු) ලෙස සේවය කළ ටී. නෙල්සන් ඒ. ප්‍රනාන්දු මයා එම තනතුරෙන් විශ්‍රාම ගැන්වීමෙන් පසු 2011.05.02 දින සිට 2015.10.28 වන දින දක්වා කොන්ත්‍රාත් පදනම යටතේ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එකී තනතුරේම සේවය ලබා එම තනතුරට අදාළ නියමිත වැටුප, වාර්ෂික වැටුප් වර්ධක හා වැඩි වූ දීමනා ලබා නොදී සේවය ලබා ගැනීමෙන් අසාධාරණයක් සිදුව, තිබේද යන්න සහ එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

**පසුබිම සහ නඩු කාර්ය පරිපාටිය :**

ඉල්ලුම්කාර පාර්ශවය විසින් තම පළමු ප්‍රකාශය 2018.08.30 වන දින ගොනුකර ඇති අතර එකී ප්‍රකාශය මගින් තමන්ට පෙර සේවා තත්වයන් සහ තමන් විශ්‍රාම ගැන්වීමෙන් පසු තමන් සේවා දිගුවක් ඉල්ලීමේදී එකී සේවා දිගුව වෙනුවට වග උත්තරකාර පාර්ශවය විසින් තමන්ට කොන්ත්‍රාත් පදනම මත පත්වීමක් පිරිනැමීමෙන් තමන්ට සිදුවූ අගතිය පිළිබඳව කරුණු දක්වා ඇත. එමෙන්ම එසේ සිදුවූ අගතිය වෙනුවෙන් තමන්ට බේරුම්කරණය මගින් සහනයක් ඉල්ලා ඇත. මෙකී ප්‍රකාශය පිටු පහකින් යුක්ත වන අතර A1 සිට A15 දක්වා ඇමුණුම් වලින් ද යුක්ත වේ.)

ඉහත කී ප්‍රකාශය සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් මස 04 වැනි දින වග උත්තරකරු විසින් පිටු දෙකකින් යුතු උත්තර ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර එමගින් ඉල්ලුම්කරුගේ සේවය සහ සේවා තත්වයන් පිළිගෙන ඇති අතර ඉල්ලුම්කරුගේ ඉල්ලීම් පිළිබඳව ඉදිරි නඩු විභාගයේ දී ලේඛන සහිතව සාක්ෂි ලබාදීමට අදහස් කරන බව දක්වා ඇත.

ඉල්ලුම්කරු 2018 ඔක්තෝබර් මස 09 වැනි දින ප්‍රති උත්තර ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශකර ඇත්තේ අනෙකුත් සේවකයන්ට මෙන් තමාට ද, වයස අවුරුදු 60 දක්වා අඛණ්ඩව සේවය කිරීමට අවස්ථාව තිබියදී වග උත්තරකරු විසින් 2011.04.28 වන දින සිට තමා සේවයෙන් විශ්‍රාම යැවීම සහ ඉන්පසු කොන්ත්‍රාත් පත්වීමක් ලබාදීම සාධාරණ සහ යුක්ති සහගතද යන්න පිළිබඳව වග උත්තරකාර පාර්ශවය සිය ප්‍රකාශයෙන් කරුණු දක්වා නොමැති බැවින් එකී කරුණු විසඳා ගැනීම සඳහා සාක්ෂි මෙහෙයවීම අවශ්‍ය බවට කරුණු දක්වා ඇත.

තවද වග උත්තරකරුගේ ප්‍රකාශයේ හත්වන වගන්තිය මගින් ඉල්ලුම්කරු සහ වග උත්තරකරු අතර වැටුප් පිළිබඳව ආරාවුලක් තිබූ බව වග උත්තරකරු පිළිගෙන ඇති හෙයින් එම ආරාවුල විසඳා ගැනීම සඳහා සාක්ෂි මෙහෙයවීම අවශ්‍ය බව ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශකර කර ඇත.

2018.11.16 දින මෙම නඩුව පළමුවර විභාගයට ගත් අතර මෙම ආරාවුල සමථයට පත්කර ගැනීමට දෙපාර්ශවය සමඟ සාකච්ඡා කළ අතර, ඉල්ලුම්කාර පාර්ශවය සමථ යෝජනාවක් ඉදිරිපත් කරමින් කියා සිටියේ 2011.04.29 සිට 2015.10.28 දින දක්වා නොගෙවන ලද වැටුප් වර්ධක, අයවැය මගින් ලබාදුන් වාර්ෂික වැටුප් වැඩිවීම්, සහ ජීවන වියදම් දීමනාව යනාදිය ගණනය කර ලබාදෙන ලෙසත් එසේම අවසාන වැටුප් පාදය දක්වා සේවක අර්ථසාධක අරමුදල් සහ පාරිතෝෂිත මුදල් ගණනය කර ගෙවන්නේ නම් සමථයකට පත් විය හැකි බවයි. මෙකී යෝජනාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඒ පිළිබඳව සලකා බලා වාර්තා කිරීමට වග උත්තරකාර පාර්ශවය එකඟ වේ. කෙසේ වුවද සමථයක් පිළිබඳව පසුව සලකා බලන තෙක් නඩු විභාගය පවත්වාගෙන යාමට දෙපාර්ශවයම එකඟ විය. ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශවය ඉල්ලුම්කරුගේ සාක්ෂිය දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කිරීමට යෝජනා කළ අතර වග උත්තරකාර පාර්ශවය ඒ පිළිබඳව විරුද්ධ නොවූයෙන් ඉල්ලුම්කරුගේ සාක්ෂිය දිවුරුම් ප්‍රකාශයක් මගින් බේරුම්කරණ කාර්යාලයට ගොනු කිරීමට එකඟ වේ.

2018.12.19 දින මෙම නඩුව විභාගය සඳහා නැවත කැඳවූ අවස්ථාවේ ඉල්ලුම්කාර පාර්ශවය ප්‍රකාශකර ඇත්තේ ඉල්ලුම්කරුගේ සාක්ෂිය වග උත්තරකරුට පිටපතක් ද සහිතව අධිකරණයට ගොනුකර ඇති බවයි. කෙසේ වුවද වග උත්තරකාර ආයතනයේ හදිසියේ සිදුවූ පරිපාලනමය වෙනස්කම් හේතුවෙන් පෙරදින ඉදිරිපත් වූ සමථ යෝජනාව සම්බන්ධයෙන් නිගමනයකට පැමිණීමට නොහැකි වූ බව වග උත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර සිටී. කෙසේ වුවද සමථයක් ඇත්නම් ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට තවත් එක් දිනයක් ඉල්ලා සිටින ලදී.

2019.02.07 දින මෙම නඩුව විභාගයට නියමිතව තිබූ අතර එදින ද සමථය සම්බන්ධයෙන් එකඟතාවයක් නොවූයෙන් නඩු විභාගය ආරම්භ කරන ලදී.

**නඩු විභාගය සහ සාක්ෂි සම්පිණ්ඩනය**

2019.02.07 දින මෙම නඩුව විභාගයට නියමිතව තිබූ අතර එදින ද සමථය සම්බන්ධයෙන් එකඟතාවයක් නොවූයෙන් නඩු විභාගය ආරම්භ කරන ලදී.

ඉල්ලුම්කරු 2018 නොවැම්බර් මස 30 දිනැති දිවුරුම් ප්‍රකාශය මගින් සිය සාක්ෂි ලබාදී ඇති අතර ඒ පිළිබඳව වග උත්තරකාර පාර්ශවය විසින් හරස් ප්‍රශ්න විමසීම 2019.02.07 දින සිදුවිය.

ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශයේ ඉල්ලුම්කරු ප්‍රකාශකර ඇත්තේ තමන් මෙම නඩුවේ වගඋත්තරකරු ලෙස නම් කර ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පූර්ව ආයතනයක් වූ සීමා සහිත කළුතර බස් සමාගමේ viii B ශ්‍රේණියේ ගිණුම් ලිපිකරුවෙකු ලෙස 2000.09.21 දින සේවයට බැඳුන බවත් එකී තනතුර 2001.04.01 දින ස්ථිර කර ඇති බවත්, ඉන්පසු 2004.06.08 වැනි දින vii B ශ්‍රේණියේ අධිකරණ සහායක තනතුරට ද, ඉන්පසු 2009.01.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි V ශ්‍රේණියේ (ආවරණ තනතුරට උසස්වීම් ලබා V වන ශ්‍රේණියේ (ආවරණ) තනතුර 2010.06.03 දින ස්ථිර කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. තවද එකී පත්වීම් උසස්වීම් සහ තනතුරුවල ස්ථිර කිරීම් ආදියට සම්බන්ධ ලිපි ලේඛන A1 සිට A5 දක්වා ලකුණුකොට දිවුරුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරු තමාගේ ප්‍රකාශයකින් වැඩි දුරටත් තහවුරු කර සිටී. ඉල්ලුම්කරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ තමන් සේවයෙන් විශ්‍රාම ගත යුතු වයස තමන්ගේ පත්වීම් ලිපිවල සඳහන් නොවුව ද රාජ්‍ය පරිපාලන අංක 95 දරන (1975) චක්‍රලේඛය හා බැඳුණු 1976 අංක 05 දරන සේවක මණ්ඩල කොට්ඨාස චක්‍රලේඛය අනුව තමන් විශ්‍රාම යා යුතු වයස අවුරුදු 55 වන බවයි. කෙසේ වුව ද, 2008.11.25 දාතමින් යුතු රාජ්‍ය චක්‍රලේඛනය අංක 52 අනුව තමන්ට අවුරුදු 60 දක්වා සේවා දිගුවක් ලබා ගැනීමේ හැකියාවක් පැවති බව ද, ඉන්පසු 2011.04.29 දතම ඇති අංක 60 දරන චක්‍රලේඛය අනුව සේවකයෙකු විශ්‍රාම යායුතු වයස අවුරුදු 55ක් වන අතර, වයස අවුරුදු 57 දක්වා සේවා දිගුවක් ඉල්ලීමකින් තොරව සේවයේ යෙදිය හැකි බව ද, ඉන්පසු වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට ඉල්ලීමක් කරන්නේ නම් සේවා අවශ්‍යතාව සහ සේවකයාගේ කාර්ය

සාධනය සලකා බලා වසරින් වසර සේවා දිගුවක් ලබාදීමට අදළ රාජ්‍ය ව්‍යවසාය කාර්ය මණ්ඩලයට හැකි බවත් අදල චක්‍රලේඛ මගින් තහවුරුව ඇති බව ඉල්ලුම්කරු වැඩිදුරටත් තම දිවුරුම් ප්‍රකාශය මගින් ප්‍රකාශ කර ඇත.

එකී චක්‍රලේඛ පිළිවෙලින් A5 සහ A7 ලෙස සලකුණු කර ඉදිරිපත් කරමින් ඉහත කී කරුණු වැඩි දුරටත් තහවුරු කර සිටී.

තවද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2013 අනුව ද රාජ්‍ය ව්‍යවසායන්හි නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55ක් ද ස්ව කැමැත්ත ඇතිව සේවා දිගුවක් ඉල්ලීමකින් තොරව වයස අවුරුදු 60 දක්වා සේවය කල හැකිව තිබූ බවද ඉල්ලුම්කරු විසින් එකී චක්‍රලේඛය A8 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරමින් කියා සිටී.

ඉහත කී චක්‍රලේඛ මත පිහිටා වග උත්තරකාර ආයතනය විසින් තම මණ්ඩලයේ සේවකයන් විශ්‍රාම ගැන්වීම සහ සේවා දිගුවන් ලබාදීම සම්බන්ධයෙන් නිකුත් කළ ලිපි සහ චක්‍රලේඛ ඉල්ලුම්කරු විසින් A9 සිට A13 දක්වා සලකුණු කර සිය දිවුරුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර සිටී.

ඉහත කී චක්‍රලේඛ මත පිහිටා වග උත්තරකාර ආයතනය විසින් නිකුත්කර ඇති A9 ලෙස සලකුණුකර ඇති ලිපියේ විධිවිධාන පරිදි ඉල්ලුම්කරු විසින් සිය සේවා දිගුව ඉල්ලා තමන් විශ්‍රාම යාමට මාස තුනකට පෙර එනම් 2011.01.12 දිනැති ලිපිය වග උත්තරකාර ආයතනය වෙත යවා ඇති බව (එකී ලිපිය A14 ලෙස සලකුණුකොට ඉදිරිපත් කරමින්) කියා සිටින අතර, එකී ඉල්ලීම තම කොට්ඨාස ප්‍රධානියා විසින් නිර්දේශ කර ලිපියක් යවා ඇති බවත් එකී ලිපිය A15 ලෙස සලකුණු කර ඉදිරිපත් කරමින් කියා සිටී. කෙසේ වුව ද මෙලෙස තමන් සේවා දිගුවක් ඉල්ලා සිටියද වග උත්තරකරු විසින් එවා ඇති 2011.03.21 ලිපිය මගින් තමන් 2011.05.02 දින සිට කොන්ත්‍රාත් සේවකයකු ලෙස සලකා කටයුතු කර ඇති බව වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. එකී කොන්ත්‍රාත් පත්වීම් ලිපිය A16 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. එකී කොන්ත්‍රාත් පත්වීමත් සමග තමන්ට A17 නමැති විශ්‍රාම ගැන්වීමේ ලිපියක් එවා ඇති බවත් එමගින් තමන් 2011.04.28 දින සිට විශ්‍රාම ගන්වා ඇති බව වැඩිදුරටත් කියා සිටී. කෙසේ වුව ද තමන් විශ්‍රාම ගැන්වීමට පෙර හිමි නිවාඩු ලබා ගැනීමට අවස්ථාවක් ලබා නොදුන් හෙයින් තමාගේ සේවය දීර්ඝ කරතැයි තමන් තුල දැඩි විශ්වාසයක් තිබූ බව වැඩි දුරටත් ප්‍රකාශකර සිටී. මේ හැර ඉල්ලුම්කරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ තමාට කොන්ත්‍රාත් පත්වීමක් පිරිනැමුව ද තමන්ට පවරා ඇති රාජකාරි කටයුතුවල කිසිදු වෙනසක් සිදුකර නොමැති බවයි. ඒ බව තහවුරු කිරීම පිණිස තමන්ට කටයුතු පවරන ලද ලිපි A18 සිට A26 දක්වා සලකුණු කර ඉදිරිපත් කර සිටී.

මේ හැර ඉල්ලුම්කරු තමන් විසින් සේවා දිගුවක් ඉල්ලමින් කල අභියාචනයන් ද, එකී සේවා දිගුව ලබාදෙන මෙන් ඉහල නිලධාරීන් විසින් කල නිර්දේශ සහිත ලිපි ද, සේවා දිගුව වෙනුවට කොන්ත්‍රාත් පදනමින් නිකුත් කල ලිපි ද A27 සිට A46 දක්වා සලකුණුකර ඉදිරිපත් කර සිටී.

ඉල්ලුම්කරු තම දිවුරුම් ප්‍රකාශයෙන් වැඩි දුරටත් ප්‍රකාශ කර සිටින්නේ වග උත්තරකරු විසින් 2015.10.29 දින කිසිම හේතුවක් නොදක්වා තම සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් තමන් විසින් කම්කරු විනිශ්චය සභාවට අභියාචනා කල බවත් එහිදී ද 2011.04.29 සිට 2016.04.27 දක්වා තමන්ගේ අඛණ්ඩ සේවා කාලය පිළිගෙන ඇති බවයි.

මේ හැර තමන්ට ගෙවන ලද 2011 වර්ෂයේ නියමිත වැටුපකින් ද, 2012 ජනවාරි සිට 2013 වර්ෂයේ දෙසැම්බර් දක්වා වැටුප් වලින් ද, රු. 25,627.42ක මුදලක් අයකර ගෙන ඇති අතර, එකී අයකර ගැනීම යුක්ති සහගත සහ සාධාරණ නොවන බව ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටී. එලෙස අයකරගත් වැටුප් පිළිබඳ ලේඛනය A47 වශයෙන් ද, ඊ අදාලව ඉල්ලුම්කරු විසින් කරන ලද අභියාචනය A48 වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කර සිටී.

මේ අනුව සේවා දිගුවක් ලබා නොදීම සම්බන්ධයෙන් තමන්ට සිදුවූ අලාභ වශයෙන් 2011.04.28 දින සිට තමාට හිමිවිය යුතු විශේෂ දීමනා සහිත වැටුප ද, ජීවන අංක දීමනාව ද, අයවැය මගින් වාර්ෂිකව වැඩිකරන වැටුප් ද, පාරිතෝෂිත සහ සේවක අර්ථසාධක මුදල් මෙන්ම එකී සියලු ගෙවීම් ප්‍රමාදය සම්බන්ධයෙන් අධිභාර මුදල් ද අයකර දෙන මෙන් සිය දිවුරුම් ප්‍රකාශයෙන් වැඩිදුරටත් ඉල්ලා සිටී. එකී හිඟ ගෙවීම් පිළිබඳ වාර්තාවක් A49 ලෙස සලකුණුකර ඉදිරිපත් කර සිටී.

මෙම නඩුව 2018.12.16 දින විභාගය සඳහා කැඳවූ අතර දෙපාර්ශවය විසින් සමථයකට එළඹීමට ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කර ඇති අතර වග උත්තරකාර පාර්ශවය කියා සිටියේ ආයතනයේ පරිපාලනමය වෙනසක් ඇති වූ හෙයින් සමථයකට එළඹීමට හැකියාක් නොමැති බවයි.

2019.02.07 දින නැවතත් මෙම නඩුව විභාගයට ගත් අතර වග උත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශය මත ලබා දී ඇති සාක්ෂි පිළිබඳව හරස් ප්‍රශ්න විමසීම සිදු කරන ලදී. මෙහිදී ඉල්ලුම්කරුගේ පත්වීම්, උසස්වීම් සහ සේවා කාලය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න විමසීම කළ අතර, ඒ පිළිබඳව දෙපාර්ශවය අතර හබ කිරීමක් නොවීය.

කෙසේ වුවද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 52 හෙවත් ඉල්ලුම්කාර පාර්ශවය විසින් සිය සාක්ෂියේ දී ඉදිරිපත් කර ඇති A6 ලේඛනය පිළිබඳව හරස් ප්‍රශ්න විමසීම සිදුකල අතර එකී චක්‍රලේඛය අනුව සේවා දිගුවක් ලබාදීම අනිවාර්ය නොවන බවත් පාලක මණ්ඩලයේ අභිමතය පරිදි සේවා දිගුව ලබාදීම හෝ නොදීම සිදුවිය හැකි බව තහවුරු කිරීමට වග උත්තරකාර පාර්ශවය විසින් හරස් ප්‍රශ්න විමසීම තුලින් උත්සාහ දරා ඇත.

තවද වග උත්තරකරු විසින් ඉල්ලුම්කරු විශ්‍රාම යවා කොන්ත්‍රාත් පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් ද ඉල්ලුම්කරු හබකර නොමැති බවට වග උත්තරකාර පාර්ශවයෙන් ප්‍රශ්න කර ඇත. එහිදී ඉල්ලුම්කාර පාර්ශවයේ ස්ථාවරය වී ඇත්තේ තමන් නිරන්තරයෙන්ම අවස්ථා කිහිපයකදී තමන්ට සේවා දිගුවක් ලබා දෙන ලෙස අභියාචනා කර ඇති බවයි. තමන්ගේ දිවුරුම් ප්‍රකාශය සමඟ අමුණා ඇති A27 සිට A34 දක්වා ලේඛන මත මෙම අභියාචනා කර ඇති බව වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. තවද තමාගේ ඉල්ලීම එසේ තම සේවය දීර්ඝ කිරීම සුදුසු බව තමන් ප්‍රාදේශීය කළමනාකර විසින් නිර්දේශකර වග උත්තරකාර පාර්ශවයට දන්වා ඇති බව ද, එකී ලේඛනය A33 ලෙස තමා විසින් සලකුණු කොට ඉදිරිපත් කර ඇති බව ද හරස් ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කරු විසින් ප්‍රකාශ කර ඇත. මේ හැර වග

උත්තර කරු විසින් හරස් ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කරුට ලබාදුන් කොන්ත්‍රාත් පදනම මත සේවය කිරීමේ පත්වීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් අභියාචනා කර නොමැති බවට ප්‍රශ්න කර ඇත. එහිදී ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ තමන් සේවා දිගුවක් ලබාදෙන මෙන් දිගටම අභියාචනා කර ඇති බවයි.

2019.05.21 දින වැඩි දුරටත් හරස් ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කරු තමන්ට ලැබුණු කොන්ත්‍රාත් පත්වීම් සම්බන්ධයෙන් අභියාචනා කර නොමැති බවට වග උත්තරකාර පාර්ශවය විසින් ප්‍රශ්න කර ඇත. මේ සම්න්ධයෙන් ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ තමන් ඒ පිළිබඳව දිගින් දිගටම අභියාචනය කල බවයි. A27 සිට A34 දක්වා සලකුණුකර දිවුරුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර ඇති ලේඛණ මගින් මෙකී අභියාචනා ඉදිරිපත් කර ඇති බවයි. ඉල්ලුම්කරු වැඩිදුරටත් ප්‍රකාශ කරන සිටින්නේ තමන් අභියාචනා කල බවත්, තමන්ගේ අභියාචනා මත තමන්ගේ අංශ ප්‍රධානි විසින් තමන්ට අසාධාරණයක් සිදුව ඇති බව නිර්දේශ කර එය නිවැරදි කර දෙන ලෙස ප්‍රධාන කාර්යාලයට සහ අදළ අංශවලට දන්වා ඇති බවයි. මේ හැර වග උත්තරකරු විසින් ඉල්ලුම්කරුට කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාදුන් අවස්ථා කිහිපයක් පෙන්වා දුන් අතර එකී අවස්ථාවන්හිදි කොන්ත්‍රාත් පදනම මත තමන්ට පත්වීම් ලබා දී ඇති බව ඉල්ලුම්කරු පිළිගනී. එකී පත්වීම් ලිපි R8 සහ R16 දක්වා සලකුණු කර හරස් ප්‍රශ්න විමසීමේදී ඉදිරිපත් කර සිටී. වග උත්තරකාර පාර්ශවය විසින් වැඩිදුරටත් ප්‍රශ්න කර සිටින්නේ කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාදීමේදී ඉල්ලුම්කරුගේ අභියාචනා මත සේවය දීර්ඝ කල බව කිසිදු තැනක සටහන් නොවන බවයි. ඉල්ලුම්කරු එහිදී ප්‍රකාශ කර සිටින්නේ ලිපිවල එසේ සඳහන් නොවුන ද තමන්ගේ සේවය ආයතනයට අත්‍යාවශ්‍ය බැවින් තමන්ගේ සේවය දීර්ඝ කර ඇති බවයි. වග උත්තරකාර පාර්ශවය නැවතත් යෝජනා කර සිටින්නේ ඉල්ලුම්කරුගේ සේවය අත්‍යවශ්‍ය වූ බැවින් එම කාලය සඳහා වග උත්තරකරුට කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාදී ඇති බවත් එය අසාධාරණ බවට ඉල්ලුම්කරු අභියාචනා කර නොමැති බවයි. එම තත්ත්වය ඉල්ලුම්කරු විසින් පිළි නොගනී.

අධිකරණයෙන් ප්‍රශ්න කිරීමේදී ඉල්ලුම්කරු ප්‍රකාශකර ඇත්තේ තමන්ට 2011 සිට 2015 දක්වා කොන්ත්‍රාත් පත්වීම් 5ක් පමණ ලැබුණු බවත් ඒ අනුව තමන් දිගටම වසර 5ක් පමණ සේවය කළ බවත්, පැමිණීම කාර්යාලයේ ලේඛනවල සටහන් කර ඇති බවත්, සේවය කඩවීමක් සිදුව ඇත්නම් එය ලිපි මගින් පමණක් සිදුව ඇති බවයි.

වග උත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ තමන් A14 ලිපිය මගින් විශ්‍රාම ගැන්වීමට මාස කිහිපයකට පෙර සේවා දිගුවක් පිළිබඳව ඉල්ලීම් කර ඇති බවයි.

මේ හැර ඉල්ලුම්කරුගෙන් නැවත ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ, විශ්‍රාම යාමට පෙරම තමන් විසින් A6 ලෙස සලකුණු කර චක්‍ර ලේඛනය අනුව සේවා දිගුවක් සම්බන්ධයෙන් ඉල්ලීම් කළ බවයි. තවද එකී ඉල්ලීම සම්බන්ධයෙන් තම කොට්ඨාස ප්‍රධානියා තමන් පළපුරුදු සහ කාර්යශූර නිලධාරියෙකු බව තම රහස්‍ය වාර්තා ද සමග (A15 ලෙස සලකුණු කර ඇති ලේඛනය මගින්) නිර්දේශ කර වග උත්තරකරු වෙත යවා ඇති බවද කියා සිටි. කෙසේ වුව ද ඒ පිළිබඳව ආයතනය විසින් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැති බව ප්‍රකාශ කරන අතර, ඒ වෙනුවට තමන්ට තමන් විශ්‍රාම යන්නටත් පෙර 2011.03.21 දිනැති (A16 වශයෙන් සලකුණු කර ඇති) කොන්ත්‍රාත් පත්වීම පිරිනමා ඇති බව ප්‍රකාශ කර සිටී. කෙසේ වුව ද තමන් විසින් තමන්ට සේවා දිගුවක් ලබාදෙන මෙන් A27 සිට A34 දක්වා සලකුණු කර ඇති ලේඛන මගින් ඉල්ලීම් කළ ද, වග උත්තරකරු විසින් තමන්ට A35 සිට A46 දක්වා සලකුණු කර ඇති ලේඛන මගින් කොන්ත්‍රාත් පත්වීම් ලබා දී ඇති බව ප්‍රකාශ කර සිටී. එසේ වුවද තමන් කිසිදු අවස්ථාවක කොන්ත්‍රාත් පත්වීමක් පිළිබඳව ඉල්ලීම් කර නොමැති බව ද වැඩි දුරටත් ප්‍රකාශ කර සිටී. මීට අමතරව සලකුණු කර ඉදිරිපත් කර ඇති A41 ලිපියෙන්ද තමන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබෙන තෙක් සේවය කිරීමට අවසර ලබාදී ඇති බවද ඉල්ලුම්කරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. මේ හැර නැවත ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශකර සිටින්නේ 2015.10.29 දින සිට තම සේවය අවසන් කිරීම පිළිබඳව තමන් අංක : PN 25/02/2016 නඩුව පානදුර කම්කරු විනිශ්චය සභාවේ ගොනු කල බවත්, එහිදී දෙපාර්ශවය අතර සමථයක් ඇති වූ අතර, ඒ අනුව තමන්ට වයස අවුරුදු 60 පිරෙන තෙක් අඛණ්ඩව සේවා කාලයක් පවතින බව පිළිගත් බවයි.

2019.05.21 දින ඉල්ලුම්කරු වෙනුවෙන් සාක්ෂිදීම සඳහා අලකාලප්පුහාමිලාගේ දුමින්ද උපුල් සමරවික්‍රම යන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ ගිණුම් ලිපිකරු ලෙස සේවයේ යෙදී ඇති අය කැඳවා ඇත. ඔහු සිය මූලික සාක්ෂි ලබා දෙමින් 2011.09.23 දින සිට ඉහත කී කාර්යාලයේ සේවය කරන බව ප්‍රකාශ කළ අතර ලේඛන බලා සාක්ෂි දීම සිදු කරන ලදී. එහිදී ඉල්ලුම්කරුට 2010 වසරෙහි ජනවාරි මස ගෙවන ලද වැටුප් පිළිබඳව සාක්ෂි විමසා සිටි අතර ඉල්ලුම්කරුගේ මූලික වැටුප රු. 9,635/- ක් බව ද, ජීවනාධාර රු. 5,250/- ක් ද, අනෙකුත් දීමනා රු. 2,250/- බවට ද සාක්ෂිකරු විසින් සාක්ෂි ලබාදෙන ලදී. තවද මේ අනුව මුළු වැටුප රු. 22,640/- බව ද ප්‍රකාශ කරන ලදී.

2019.06.11 දින වැඩිදුරටත් මූලික සාක්ෂි විමසීමේදී වැටුප් පිළිබඳව විමර්ශනය කල අතර මේ වනවිටත් සලකුණු කර ඇති A4 ලේඛනය මගින් ඉල්ලුම්කරුට 2009.01.26 සිට බලපැවැත්වෙන පරිදි 5 වන ශ්‍රේණියේ වැඩ ආවරණය කිරීමේ පත්වීමක් පිරිනමා ඇති බවට කරුණු අනාවරණය විය. මීට අමතර සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා සිටියේ එකී පත්වීම A5 ලෙස සලකුණු කර ඇති පත්වීම් ලිපිය මගින් ස්ථිර කර ඇති බවයි. A5 ශ්‍රේණිය සඳහා වූ වැටුප් පාදය 2009.01.27 දින සිට ක්‍රියාත්මක වූ බවත් ජූනි මස ඉල්ලුම්කරුට 5 ශ්‍රේණිය නිලධාරි තනතුරට උසස්කර ඇති හෙයින් වැටුපෙහි වෙනසක් පැවති බව සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින ලදී. ඒ අනුව ඉල්ලුම්කරුගේ වැටුප් වර්ධකය රු. 130/- කින් වැඩිව ඇති බව ප්‍රකාශ කර සිටින අතර 2009.01.27 සිට වැටුප් වර්ධකය වසර 02ක් ගෙවා ඇති බවද ප්‍රකාශ කර සිටී. එකී වැටුප් වර්ධකය 2012 සිට 2016 දක්වා ලබා දී නොමැති බවද ප්‍රකාශ කර සිටී. තවද ඉල්ලුම්කරු සේවය කල අවසාන මාසය වන 2011 අප්‍රේල් මස වැටුප සාක්ෂිකරු විසින් A50 ලෙස ද, 2012, 2013, 2014 යන වර්ෂ වලට අදළ වැටුප් ලේඛන පිළිවෙලින් A52, A53, A54 ලෙස සලකුණු කර ඉදිරිපත් කර සිටී. තවද, 2008 අංක 02 දරන මුදල් චක්‍ර ලේඛය A55 ලෙස ද, ඉල්ලුම්කරුගේ ශ්‍රේණියට අදළ වැටුප් සංශෝධන පිටපත 55(ඒ) වශයෙන් ඔප්පු කිරීමේ භාරයට යටත්ව සලකුණු කර සිටී. 55(ඒ) චක්‍ර ලේඛය අනුව 2008.01.01 දින සිට 05 වන ශ්‍රේණියේ නිලධාරියෙකුගේ ආරම්භක වැටුප රු. 10,105/- බවත්, 2001 අංක 01 දරන මුදල් කොට්ඨාස චක්‍රලේඛය A56 ලෙස සලකුණු කරමින් එකී චක්‍රලේඛය අනුව රු. 1,250/- ක අතුරු දීමනාවක් ඉල්ලුම්කරුට ද ගෙවා ඇති බවත්, එය 2001.10.01 දින

සිට ක්‍රියාත්මක බවත් කියා සිටී. මීට අමතරව සාක්ෂිකරු විසින් A57 වශයෙන් චක්‍රලේඛයක් සලකුණු කරමින් ප්‍රකාශ කර සිටින්නේ ඒ අනුව ද රු. 1,000/- අතුරු දීමනාවක් අනුමත කී ඇති අතර, එකී දීමනාවද ඉල්ලුම්කරුට ගෙවා ඇති බවයි.

2019.07.17 දින ඉල්ලුම්කාර පාර්ශවයේ සාක්ෂිකරුගෙන් මූලික සාක්ෂි විමසීම් කළ අතර එහිදී සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ 2012 අංක 2 චක්‍ර ලේඛනයන් අනුව සිදුවූ වැටුප් වැඩිවීම් ඉල්ලුම්කරුට නොගෙවූ බවත් ඒ වන විට ඉල්ලුම්කරු විශ්‍රාමගෙන කොන්ත්‍රාත් පදනම මත සේවය කළ බැවින් මෙලෙස ගෙවීම් නොකළ බවයි. 2012 අංක 2 චක්‍රලේඛය මෙහිදි A58 ලෙස සලකුණු කර සිටී. කෙසේ වුව ද සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ 2012 අංක 01 දරන මුදල් චක්‍රලේඛනය අනුව ඉල්ලුම්කරුට එහි දක්වෙන ප්‍රතිලාභ ගෙවා ඇති බවයි. එකී චක්‍රලේඛය A59 ලෙස සලකුණු කර සිටී. මේ හැර 2013 අංක 04 චක්‍රලේඛය A60 ලෙස සහ 2013 අංක 05 දරන චක්‍රලේඛය A60 ලෙස ද සලකුණු කර සාක්ෂි දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටින්නේ කොන්ත්‍රාත් පදනම මත සිටින බැවින් ඉල්ලුම්කරුට මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන ක්‍රියාත්මක නොකළ බවයි.

කෙසේ වුව ද 2001 අංක 01 චක්‍රලේඛය A62 ලෙස සලකුණු කරමින් සහ දැනටමත් A57 ලෙස සලකුණු කර ඇති 2000 අංක 04 දරන චක්‍රලේඛය යන එකී චක්‍රලේඛවල ප්‍රතිපාදන ඉල්ලුම්කරුට ලබා දී ඇති බවයි. මේ හැර 2011 අංක 01 චක්‍රලේඛය එනම් සාක්ෂිකරු විසින් ලකුණුකර ඇති A58 ලේඛනයේ සඳහන් ප්‍රතිපාදන ද ඉල්ලුම්කරුට ලබාදී ඇති බව කියා සිටී. තවද 2013 අංක 2 චක්‍රලේඛයට (2013 අයවැය යෝජනා අනුව රාජ්‍ය ව්‍යවස්ථා, ව්‍යවස්ථා මණ්ඩල සහ ව්‍යාපෘති කාර්ය මණ්ඩල දීමනා සංශෝධනය) අනුකූල දීමනා ද ඉල්ලුම්කරුට ගෙවා ඇති බව ප්‍රකාශ කර සිටී. එකී චක්‍රලේඛය A63 ලෙස සලකුණු කර සිටී.

මීට අමතරව ඉල්ලුම්කරු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති බැවින් A64, A65 සහ A66 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇති පිළිවෙලින් 2014 අංක 1 චක්‍රලේඛය අනුව ජීවන වියදම් දීමනාව ද, 2014 අංක 03 චක්‍රලේඛයේ අන්තර්ගත දීමනා ද, 2015 අංක 02 චක්‍රලේඛයේ දීමනා ද, ඉල්ලුම්කරුට ගෙවා නොමැති බවත් එසේ වන්නේ ඉල්ලුම්කරුගේ සේවා තත්වය අනුව එසේ ගෙවීමට තමන්ට උපදෙස් ලබාදී නොමැති බැවින් බවද වැඩි දුරටත් කියා සිටී.

2019. 07.25 දින ඉහත කී ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදුකල අතර, ඉල්ලුම්කරු කොන්ත්‍රාත් පදනමින් පත් කර ඇති බවත්, එකී කොන්ත්‍රාත් පත්වීමේ සඳහන් පරිදි ඔහුට අවසානයට ලබාගත් වැටුප ගෙවීමට නියම කර ඇති හෙයින් 2012 සිට 2016 දක්වා ඔහුට වැටුප් වර්ධක ලබා දී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. තවද A58 චක්‍රලේඛය පෙන්වමින් එය R17 ලෙස ද සලකුණු කරමින් එකී ලේඛනය අනුව එහි ප්‍රතිපාදන කොන්ත්‍රාත් පදනමේ සේවකයන්ට අදාළ නොවන බවට ප්‍රශ්ණ කළ අතර සාක්ෂිකරු ද එය කොන්ත්‍රාත් සේවකයන්ට අදාළ නොවන බව පිළිගනී. එමෙන්ම 2013 අංක 04 දරන චක්‍රලේඛය ද හරස් ප්‍රශ්න විමසීමේදී R18 ලෙස සලකුණු කරමින් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටිනේ එකී චක්‍ර ලේඛනය ද කොන්ත්‍රාත් පදනමේ සේවකයන්ට එහි ප්‍රතිපාදන අදළ නොවන බැවින් ඉල්ලුම්කරුට එහි ප්‍රතිපාදන නොලැබී ඇති බවයි. කෙසේ වුවද R18a ලෙස එකී චක්‍රලේඛයේ සටහන්ව ඇති කළමනාකාර (මුදල්) විසින් වේතන ලිපිකරුට ලබා දී ඇති උපදෙස් අනුව මෙම ගෙවීම සිදුකර නොමැති බවද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

2019.07.25 දින ඉල්ලුම්කාර පාර්ශවයෙන් වග උත්තරකාර ආයතනයේ මුදල් කළමනාකාර ලෙස සේවය කරනු ලබන කැටිකොල විතානගේ සමන් කුමාර යන අය කැඳවා සිටී. එකී සාක්ෂිකරුගෙන් A51 ලෙස සලකුණු කළ ලේඛනය පෙන්වා ප්‍රශ්න කර සිටී. එකී ලේඛනය 2011 වර්ෂයට අදාළ වැටුප් ලේඛනයක් බවත්, ඒ අනුව 2011 වර්ෂයට අදාළ වැටුප් වර්ධක ඉල්ලුම්කරුට ගෙවා ඇති බවත් ප්‍රකාශ කර සිටී. කෙසේ වුවද සාක්ෂිකරු වැඩි දුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටිනේ A52, A54, A54(a) වශයෙන් මෙම නඩු විභාගයේ දී ලකුණුකර ඇති ලේඛන අනුව පිළිවෙලින් 2012, 2013, 2015 වර්ෂවලට අදාළ වැටුප් වර්ධක ලබාදී නොමැති බවයි. තවද A55 සහ A55(a) අනුව වැඩිවිය යුතු වැටුප් වර්ධක ද 2012 වර්ෂයට ගෙවා නොමැති බවත්, මෙම වැටුප් වැඩිවීමට අදාළ චක්‍රලේඛනය 2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූවක් බවත් සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. මේ හැර A58 චක්‍රලේඛය අනුව 5 වැනි ශ්‍රේණියේ නිලධාරියකු වශයෙන් ඉල්ලුම්කරුගේ වැටුප වැඩිවිය යුතු වුවත්, ඔහු කොන්ත්‍රාත් පදනම මත සේවය කළ බැවින් ඔහුට එකී ප්‍රතිපාදන ලබාදී නොමැති බව සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. A63 චක්‍රලේඛය අනුව වැටුප් වැඩිවීම වැරදීමකින් ඉල්ලුම්කරුට ගෙවා තිබුන ද එය ආපසු අයකර ගැනීමට කටයුතු කිරීමට ඉඩ ඇති බව ද වැඩිදුරටත් සාක්ෂිකරු විසින් ප්‍රකාශ කර ඇත.

කෙසේ වුවද සාක්ෂිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර සිටින්නේ ඉල්ලුම්කරු අවසානයට ලැබූ වැටුපට අනුව වැටුප් ගෙවන මෙන් කොන්ත්‍රාත් පත්වීමේ තිබුණ බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. එසේ වුව ද ''ඉල්ලුම්කරු එයට එකඟවී කොන්ත්‍රාත් පත්වීම භාර ගත්තේදැයි විමසීමේදී '' ලිපියේ අත්සන් කළ බවට සටහන් නොමැති බවත් වැඩි දුරටත් ප්‍රකාශ කර සිටී.

A47 මින් පෙර සාක්ෂි විමසීමේදී සලකුණු කළ ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටී.

එකී ලේඛනය අනුව 2012 අංක 01 මුදල් චක්‍රලේඛය අනුව ගෙවා ඇති වැටුප් වැඩිවීමක් ඉල්ලුම්කරුගෙන් ආපසු අයකරගෙන ඇති බවත්, විගණන විමර්ශනයක් අනුව එසේ කර ඇති බවත් සාක්ෂිකරු කියා සිටී. තවද 2012 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා මෙලෙස ගෙවා ඇති රු. 28,173.92 ක මුදල ද 2014 ජනවාරි මස සිට උපරිමයකට යටත්ව ඉල්ලුම්කරුගේ වැටුපෙන් අඩුකර ඇති බව ද වැඩි දුරටත් ප්‍රකාශ කර සිටී. තවද එකී මුදල නැවත ලබාදෙන මෙන් ඉල්ලුම්කරු A48 ලේඛනයෙන් නැවත ඉල්ලීමක් කර ඇති බවද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී.

වග උත්තරකාර පාර්ශවය විසින් සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කරු කොන්ත්‍රාත් පදනම මත සේවය කළ බවට සාක්ෂි ලබා දී ඇති අතර, ඒ අනුව ඉල්ලුම්කරු 2011 වර්ෂයේ අවසාන වරට ලබාගත් වැටුපට සහ දීමනාවලට අනුකූලව කොන්ත්‍රාත් පදනම මත සේවය සඳහා ගෙවීම් නියමව ඇති බව ප්‍රකාශ කර ඇත. මේ හැර ඉල්ලුම්කරුට 2012 සිට 2016 වර්ෂය දක්වා වැටුප් වර්ධක ගෙවා නොමැති බවත් එයට හේතුව එකී කාලය තුළ ඔහු කොන්ත්‍රාත් පදනම මත සේවය කළ බවත් යන්න සාක්ෂිකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. තවද A58, R17 ලේඛන පෙන්වා

සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීමේදී කොන්ත්‍රාත් පදනමේ සේවකයන්ට මෙම චක්‍රලේඛය අදාළ නොවන බව ද එය R17(a) කොටසේ සඳහන් බවද ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටී. එමෙන්ම R19 ලේඛනය සලකුණු කර ඉදිරිපත් කොට සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීමේදී සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ එකී ලේඛනය විගණන විමසුමක් බවත්, ඒ අනුව වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු අයකර ගැනීමට ගණකාධිකාරිවරයාගේ උපදෙස් මත බලය ඇති බවත්, එකී ලේඛනයේ සඳහන්ව ඇති මුදල් සාවද්‍ය ගණනය කිරීමක් නිසා ආපසු අයකරගෙන ඇති බවයි. මේ අනුව මෙම ඉල්ලුම්කරුට චක්‍රලේඛවලට අනුව නියමිත කාලවලදී වැටුප් ගෙවා ඇති බව වැඩිදුරටත් කියා සිටී. නැවත ප්‍රශ්ණ විමසීමේදී සාක්ෂිකරු තවදුරටත් ප්‍රකාශ කරන්නේ විශ්‍රාම ගැන්වීමෙන් පසු නිකුත් කරන වැටුප් සංශෝධන සහ දීමනා ඉල්ලුම්කරුට අදාළ නොවන බවයි.

මෙදින A1 සිට A66 දක්වා ලේඛන සලකුණු කරමින් ඉල්ලුම්කාර පාර්ශවයේ සාක්ෂිය අවසන් කරන බව එම පාර්ශවය කියා සිටී. එමෙන්ම වග උත්තරකාර පාර්ශවය කියා සිටින්නේ ඉදිරි දින තම සාක්ෂිකරුවන් කැඳවන බවයි.

ඉල්ලුම්කරු මෝසම් පත්‍රයක් ගොනු කරමින් ඉල්ලුම්කරු වෙනුවෙන් නව සාක්ෂිකරුවකු කැඳවීමට අයැද සිටී. ඒ අනුව මෙම නඩුව 2019.08.22 දින කැඳවීමේදී ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් ඩී. ඩී. එල්. එඩ්වඩ් යන සාක්ෂිකරු සඳහා කැඳවා ඇත. මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ තමන් 1977.06.11 දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයට බැඳුනු බවත් 2010 දින වයස අවුරුදු 55න් විශ්‍රාම ගිය බවත් 2007 චක්‍රලේඛයක් අනුව තමන් සේවා දිගුවක් ඉල්ලා සිටි අතර A67 වශයෙන් ලේඛනයක් සලකුණු කරමින් ඒ අනුව තමා විශ්‍රාම යැවුව ද, A68 ලෙස ලේඛනයක් සලකුණු කර ඉදිපත් කරමින් එකී ලේඛනය අනුව තමන්ට සේවා දිගුවක් ලබා දී ඇති බවද ප්‍රකාශ කර සිටී. එකී ලේඛන අනුව 2011.02.10 දින විශ්‍රාම යවා 2011.07.11 දිනට නැවත සේවා දිගුව ලබා දී ඇති බව ද, එය අඛණ්ඩ සේවා දිගුවක් බවද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. මීට අමතරව තමන්ට III ශ්‍රේණියේ ප්‍රාදේශීය කළමනාකාර තනතුරේ (ආවරණ) සිට I ශ්‍රේණියේ ප්‍රාදේශීය කළමනාකාර තනතුරට උසස් වීමක් එකී සේවා දීර්ඝය කළ කාලය තුළ ලබාදී ඇති බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. එකී උසස්වීම් ලිපිය A69 ලෙස සලකුණු කර ඉදිරිපත් කර සිටී. මීට අමතරව තමන් විශ්‍රාම යාමට පෙර විශ්‍රාම පූර්ව නිවාඩු ලබා නොතිබූ හෙයින් එකී කාලය සඳහා තමන්ට මාස තුනක වැටුප ද ලැබුණු බව පවසා සිටී. තවද අධිකරණයෙන් ප්‍රශ්න කිරීමේදී තමන්ට සේවා දිගුව ලබාදී ඇත්තේ කොන්ත්‍රාත් පදනම මත නොව අඛණ්ඩ පදනම මත බව වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසමින් වග උත්තරකාර පාර්ශවය සාක්ෂිකරු විසින් සලකුණු කර ඉදිරිපත් කළ ලේඛන (A67, A68, A69 ලේඛන) ඉල්ලුම්කරුට සම්බන්ධයක් නොමැති ලේඛන බවට හබ කර සිටින අතර, ඉල්ලුම්කරුගේ නඩුවට සාක්ෂිකරුගේ සාක්ෂිය කිසිදු සම්බන්ධයක් නොමැති බවට ද යෝජනා කර සිටී. (කෙසේ වුවද ඉල්ලුම්කරු A1 සිට A69 දක්වා ලේඛන සලකුණු කොට සාක්ෂි මෙහෙයවා ඇති අතර අද දින සිය සාක්ෂි අවසන් කරන බව කියා සිටී).

2019.09.25 දින වග උත්තරකාර පාර්ශවය වෙනුවෙන් සාක්ෂිදීම සඳහා 2013 ජනවාරි මස සිට 2014 අප්‍රේල් මස 18 දින දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගණකාධිකාරී ලෙස සේවය කළ එල්. කේ. අයි. ගයනි යන අය ඉදිරිපත්ව සාක්ෂි දී ඇත. සාක්ෂිකාරිය තම සාක්ෂියේ දී, ප්‍රකාශ කර ඇත්තේ කළුතර ප්‍රාදේශීය කාර්යාලය සඳහා ප්‍රාදේශීය ගණකාධිකාරී වරයෙකු නොවූ බැවින්, තමන් විසින් එම කටයුතු ආවරණය කළ බවත් ය. සාක්ෂිකාරියට R18 ලේඛනය පෙන්වා සිටි අතර එය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මුදල් චක්‍රලේඛනය ලෙස ඇය විසින් හඳුනා ගත් අතර එහි ඉහලින් ඇති සටහන සහ අත් අකුරු ද තමන්ගේ බවට හඳුනාගෙන ඇති අතර, එකී සටහනෙහි ''ප්‍රධාන මූල්‍ය කළමනාකාරගේ උපදෙස් පරිදි කොන්ත්‍රාත් සේවකයනට මෙම මුදල් හිමි නොවේ '' යනුවෙන් සටහන් කර ඇති බවද ප්‍රකාශ කර ඇත. ඒ අනුව කොන්ත්‍රාත් සේවකයන්ට ඉහත කී චක්‍රලේඛය අදාළ නොවන බව වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

ඉල්ලුම්කාර පාර්ශවය සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදුකළ අතර R18 ලේඛනය පෙන්වා එහි ඇතුළත් සටහන එනම් ''ප්‍රධාන මූල්‍ය කළමනාකාර තැනගේ උපදෙස් පරිදි කොන්ත්‍රාත් සේවකයන්ට මෙම දීමනා මුදල් හිමි නොවේ '' යන සටහන තමන් විසින් ඇතුළත් කලේ ද යන්න විමසා සිටී. සාක්ෂිකාරිය විසින් තමා එම සටහන තැබූ බව පිළිගන්නා අතර, ඉල්ලුම්කාර පාර්ශවය වැඩිදුරටත් ප්‍රශ්න කරන්නේ ගණකාධිකාරී ලෙස ඒ වන විට සාක්ෂිකාරියට චක්‍රලේඛය පිළිබඳව දැනුවත් බවක් තිබිය යුතු බවයි. කෙසේ වුව ද, සාක්ෂිකාරිය පවසා සිටින්නේ තමන්ට අවබෝධයක් නොමැති නිසා මෙවැන්නකට මූල්‍ය කළමනාකාර තැනගේ උපදෙස් ලබා ගැනීමෙන් පසු ඉහත කී සටහන යෙදූ බවයි. කෙසේ වුව ද ඉල්ලුම්කාර පාර්ශවය තවදුරටත් එකී ප්‍රකාශය ගැන හබකර ප්‍රකාශ කර සිටින්නේ 2013 අංක 14 දරන චක්‍රලේඛය A60 ලෙස ද ඉල්ලුම්කාර පාර්ශවය විසින් සලකුණු කර ඇති අතර එකී චක්‍රලේඛයේ කොතැනක හෝ කොන්ත්‍රාත් සේවයට එකී චක්‍රලේඛය අදාළ නොවන බව සටහන්ව නොමැති බැවින් සාක්ෂිකාරියගේ ඉහත කී සටහන නීත්‍යානුකූල නොවන බවයි. සාක්ෂිකාරිය ද ඊට පිළිතුරු දෙමින් චක්‍ර ලේඛයේ කොන්ත්‍රාත් සේවකයන්ට එය අදාළ නොවන බවට සටහනක් නොමැති බව පිළිගන්නා අතර තමා එම සටහන යොදා ඇත්තේ මූල්‍ය කළමනාකාර තැනගේ උපදෙස් මත බව ද වැඩි දුරටත් ප්‍රකාශ කර සිටී. තවද සාක්ෂිකාරියගෙන් එකී සටහන සම්බන්ධයෙන් වෙනත් ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කළ හැකි ද යන්නට සාක්ෂිකාරිය ප්‍රකාශ කරන්නේ එවැන්නක් ඉදිරිපත් කළ නොහැකි බවයි. මේ හැර ඉල්ලුම්කාරියට A54 සලකුණු කරන ලද ලේඛනයක් පෙන්වා එහි ඇයගේ අත්සන ඇති බව තහවුරු කර ගනී. සාක්ෂිකාරිය කියා සිටින්නේ එය තමා විසින් වැටුප් ලේඛනයක් සහතික කිරීමක් බවත් තමන් එකී ලේඛන එකිනෙක පරීක්ෂා නොකරන බවත් සකස්කළ නිලධාරියා මත ඇති විශ්වාසය මත අත්සන් කරන බවත් ය.

සාක්ෂිකාරියගෙන් නැවත ප්‍රශ්න විමසීම සිදුකළ අතර එහිදී සාක්ෂිකාරිය ප්‍රකාශකර සිටින්නේ කොන්ත්‍රාත් පදනමේ සේවකයන් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ කිසිත් නොතිබූ බවත් එබැවින් සාක්ෂිකාරිය විසින් ඔවුන්ට කරන ගෙවීම් සම්බන්ධයෙන් මුදල් කළමනාකාරවරයාගෙන් උපදෙස් ලබාගෙන කටයුතු කළ බවත් ය.

2019.11.06 දින මෙම නඩුව නැවත කැඳවූ අවස්ථාවේ වගඋත්තරකාර පාර්ශවය R1 සිට 18(a) දක්වා ලේඛන සලකුණු කරමින් වගඋත්තරකාර පාර්ශවයේ නඩුව අවසන් කරන බව ප්‍රකාශ කරන ලද අතර ඒ අනුව නඩු විභාගය අවසන් විය.

**සාක්ෂි විශ්ලේෂණය සහ ප්‍රදනය ඉදිරිපත් කිරීමේ ස්ථාවරය**

2018.11.06, 2018.12.19 දිනයන්හි මෙම නඩුව සමථයකට පත් කර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්ශවය සමඟ සාකච්ඡා කල අතර සමථයක් නොවීය. ඒ අනුව 2019.02.07 දින මෙම නඩුව විභාගයට ගන්නා ලදී.

1. මෙම නඩුවේ ඉල්ලුම්කරුගේ පත්වීම් සහ උසස්වීම් පිළිබඳව ඉල්ලුම්කරු විසින් සිය දිවුරුම් ප්‍රකාශයෙන් කරුණු දක්වා ඇති අතර, ඒ පිළිබඳව වග උත්තරකරු විසින් හබ කිරීමක් නොකරයි.

2. දෙපාර්ශවයේම සාක්ෂි විමසා බැලීමේදී පෙනීයන්නේ මෙම නඩුවට අදළ මූලික ආරාවුල වී ඇත්තේ ඉල්ලුම්කරු විසින් සේවා දිගුවක් ඉල්ලා ඇති අතර වග උත්තරකාර ආයතනය විසින් එය ලබා නොදී ඒ වෙනුවට කොන්ත්‍රාත් පදනම මත වරින් වර සේවකයාට කොන්ත්‍රාත් පත්වීම් ලිපි නිකුත් කරමින් වසර පහක පමණ කාලයක් සේවය ලබා ගැනීමට කටයුතු කිරීම වේ.

   මෙහිදී විමසා බැලිය යුතු මූලික කරුණ වන්නේ එවකට පැවති නීති රාමුව තුළ සේවකයාට සේවා දිගුවක් ලබාදීමට ආයතනයට හැකියාවක් තිබේද යන්නයි. ඉල්ලුම්කරු විසින් සිය මූලික සාක්ෂිය 2018.11.30 දිනැති දිවුරුම් ප්‍රකාශය මගින් ඉදිරිපත් කර ඇති අතර එහිදී තමන්ට සේවා දිගුවක් ලබා ගැනීමට හැකියාවක් පැවති බවට සාක්ෂි ලබා දී ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් ගත් තීරණයන්ට යටත්ව රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීම පිළිබඳව වරින්වර නිකුත්කර ඇති චක්‍රලේඛන සලකුණු කර ඉදිරිපත් කරමින් මේ බව තහවුරු කිරීමට ඉල්ලුම්කරු උත්සාහ ගෙන ඇත. ඉල්ලුම්කරු විසින් සලකුණු කර ඇති A6, A7, A8 චක්‍රලේඛ සහ ඊට අනුරූපව වග උත්තරකාර ආයතනය විසින් තම ආයතනයේ සේවකයන්ගේ සේවා දිගුවන් සහ විශ්‍රාම ගැන්වීම පිළිබඳව ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව නිකුත් කළ ලිපි A9, A10 වශයෙන් සහ සෙසු චක්‍රලේඛ පිළිවෙලින් A11, A12, A13 වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරු දිවුරුම් ප්‍රකාශය මගින් සාක්ෂි දී ඇත.

1. A6 හෙවත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 52 අනුව (අංක රාව්‍යාදෙ/44 හා 2007.07.31 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට කරන ලද සංශෝධනය අනුව)

   (a) සේවකයකුගේ විශ්‍රාමික වයස අවුරුදු 55 වන අතර

   (b) වයස අවුරුදු 55න් ඔබ්බට සේවය ලබාගන්නේ නම් සේවකයාගේ එකඟතාවය මත සේවකයින්ගේ සේවා වාර්තා, චර්යා සටහන්, පැමිණීම, කාර්යක්ෂමතාවය සහ සෞඛ්‍ය තත්ත්වය සලකා බලා අවුරුදු 57 දක්වා සේවා දිගු ලබාදීමට රාජ්‍ය ව්‍යවසායේ පාලක මණ්ඩලයට හැකිය.

   (c) ඊට අමතර අතිවිශේෂ අවස්ථාවන්හිදී සේවකයකුගේ සේවය අත්‍යාවශ්‍ය බව පාලක මණ්ඩලය අදහස් කරන්නේ නම් සේවකයකුගේ සේවය අවුරුදු 57 සිට 60 දක්වා දීර්ඝ කිරීමට පාලක මණ්ඩලයට ක්‍රියා කළ හැකිය.

2. A7 හෙවත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 60 ඃ (2001 මැයි 1 සිට ක්‍රියාත්මකයි) ඒ අනුව,

   (a) රාජ්‍ය ව්‍යවසායන්හි නිලධාරීන්ගේ විශ්‍රාම ගැනීමේ වයස අවුරු 55 වේ.

   (b) රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන්ට ස්ව කැමැත්ත මත සේවා දිගුවක් ඉල්ලීමකින් තොරව වයස අවුරුදු 57 දක්වා සේවය කළ හැකිය.

   (c) වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවලදී එම ආයතනය සඳහා වන සේවා අවශ්‍යතාවය සහ සේවකයාගේ කාර්ය සාධනය සැලකිල්ලට ගෙන වසරින් වසර සේවා දිගුවක් ලබාදීමට අදළ රාජ්‍ය ව්‍යවසාය කාර්ය මණ්ඩලයට ක්‍රියා කළ හැකිය.

   (d) චක්‍රලේඛ අංක 44 සහ 52 මෙම චක්‍රලේඛය මගින් අවලංගුකර ඇත.

3. A8 හෙවත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013 (2013.01.01 සිට ක්‍රියාත්මකයි)

   මෙකී චක්‍රලේඛය අනුව

   (a) රාජ්‍ය ව්‍යවසායන්හි නිලධාරීන්ගේ විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 55 වේ. 55න් ඔබ්බට සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම් සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස වන අවුරුදු 60 දක්වා සේවයේ රැඳී සිටිය හැක.

   (b) අවුරුදු 55 සිට 60 දක්වා කාලය තුළ නිලධාරියාගේ අභිමතය පරිදි විශ්‍රාම යන්නේ නම් පත්වීම් බලධාරියා වෙත මාස තුනක පූර්ව දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව විශ්‍රාම යා හැකිය.

   (c) කාර්යක්ෂමතාවය සහ කාර්යසාධනය සතුටුදයක නොවන නිලධාරියකුට වයස අවුරුදු 55න් ඔබ්බට සේවා දිගුවක් ලබා නොදීමට පත්වීම් බලධාරියා තීරණය කරන්නේ නම් නිලධාරියාට ඊට විරුද්ධව අභියාචනා කිරීමට සැලසෙන ආකාරයෙන් මාස තුනක පූර්ව දැනුම්දීමකින් පසුව විශ්‍රාම ගැන්වීමේ බලය පත්වීම් බලධාරියා සතුවේ.

   (d) විශ්‍රාම ගැන්වීම පිළිබඳව මීට පෙර නිකුත් කළ චක්‍රලේඛ අංක 60 මෙයින් අවලංගු වේ.

ඉහත කී චක්‍රලේඛවලට අනුරූපව සේවකයාගේ කාර්යක්ෂමතාවය, චර්යාව, සෞඛ්‍ය තත්ත්වය ආදී කරුණු සලකා බලා සේවා දිගුවක් ලබාදීමේ හැකියාව රාජ්‍ය ව්‍යවසායන්ට ඇති බව පැහැදිලි වේ.

A6 හෙවත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 52 (2008.11.25) අනුව වයස අවුරුදු 55න් ඔබ්බට සේවය ලබාගන්නේ නම් ''**සේවකයාගේ එකඟතාවය මත සේවකයින්ගේ සේවා වාර්තා, චර්යා සටහන්, පැමිණීම, කාර්යක්ෂමතාවය සහ සෞඛ්‍ය තත්ත්වය සලකා බලා අවුරුදු 57 දක්වා සේවා දිගු ලබාදීමට රාජ්‍ය ව්‍යවසායේ පාලක මණ්ඩලයට හැකිය.** ''යනුවෙන් සඳහන් කර ඇත.

කෙසේ වුව ද, ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශය අනුව ඉල්ලුම්කරු විසින් A6 හෙවත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 52හි ප්‍රතිපාදන සහ ඊට අනුරූපව වගඋත්තරකාර පාර්ශවය විසින් නිකුත්කර ඇති A9 වශයෙන් සලකුණු කර ඇති ලේඛනයේ උපදෙස් ද අනුගමනය කරමින් වයස අවුරුදු 55න් එනම් විශ්‍රාම යායුතු දිනට මාස තුනකට පෙරාතුව වග උත්තරකාර ආයතනයෙන් සේවා දිගුවක් ඉල්ලා ඇති අතර එකී ඉල්ලීම A14 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. එමෙන් ම, ඔහුගේ කොට්ඨාශ ප්‍රධානියා විසින් එකී ඉල්ලීම නිර්දේශ කර ඉදිරිපත් කර ඇති බවද, එකී නිර්දේශය අඩංගු A15 ලේඛනය සලකුණු කර ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරු සාක්ෂි ලබා දී ඇත. ඉහත කී ඉල්ලුම්කරුගේ ඉල්ලීම අනුව ඔහු මුලින්ම වසරක සේවා දිගුවක් ඉල්ලා ඇත. ඔහුගේ අංශ ප්‍රධානියා විසින් එම සේවා දිගුව නිර්දේශ කර ඇත්තේ (A15 ලේඛනයට අනුව) ''ඉල්ලුම්කරු විසින් කරන ලද කටයුතු කිරීමට එම කාර්යාලයේ වෙනත් නිලධාරියකු නොමැති බව සහ එම නිලධාරී මහතා කාර්යශූර නිලධාරියකු බව'' සඳහන් කරමිනි. මේ අනුව සේවා අවශ්‍යතාවය සහ නිලධාරියාගේ කාර්යක්ෂමතාවය යන කරුණු සනාථ වුව ද වග උත්තරකාර පාර්ශවය විසින් ඔහුගේ ඉල්ලීම නොසලකා හැර ඔහුට පූර්ව දැනුම් දීමකින් ද තොරව වයස අවුරුදු 55 දී (2011.04.28 දින) විශ්‍රාම යවා ඇති බව ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශය අනුව තහවුරු වේ.

3. මේ හැර A15 මගින් ඉල්ලුම්කරුගේ කොට්ඨාශ ප්‍රධානියා ඉල්ලුම්කරුගේ සේවය ඇගයීම, සේවා දිගුවක් ලබාදීම නිර්දේශ කළා මෙන්ම පසු කාලීනව ඉල්ලුම්කරුගේ ආසන්නතම ප්‍රධානීන් ද ඉල්ලුම්කරුගේ සේවය ඇගයීමට ලක්කර ඔහුට සේවා දිගුවක් ලබාදෙන මෙන් (ඉල්ලුම්කරු විසින් පසුකාලීනව සේවා දිගුවක් ලබාදෙන මෙන් කරන ලද අභියාචනාවන් මත) නිර්දේශ කර ඇති බව සේවකයා විසින් දිවුරුම් ප්‍රකාශ මඟින් සාක්ෂි ලබාදීමේදී සලකුණු කොට ඉදිරිපත්කර ඇති පහත ලේඛණ අනුව පැහැදිලි වේ. එනම් ඃ

(අ) A28 ලේඛනය මත කර ඇති නිර්දේශය අනුව '' මොහු විසින් කරනු ලබන කාර්ය භාරය සලකා බලා මොහුගේ සේවය වයස 60 දක්වා දීර්ඝ කිරීම නිර්දේශ කර ඉදිරිපත් කරමි '' යනුවෙන් ද,

(ආ) A30 ලේඛනයේ සඳහන් පරිදි ප්‍රධාන නීති නිලධාරිණියගේ නිර්දේශය අනුව ''කළුතර ප්‍රදේශයේ නඩු කටයුතු වලදී ශ්‍රී ලංගමට වාසිදයක ලෙස තීන්දු ලබා ගැනීමට ඇප කැපවී ක්‍රියා කරන, පවරන රාජකාරීන් දක්ෂ ලෙස ඉටුකරන කාර්යක්ෂම නිලධාරියකු වන ටී. එන්. ඒ. ප්‍රනාන්දු මහතාගේ සේවය දීර්ඝ කිරීම නිර්දේශ කොට ඉදිරිපත් කරමි '' යනුවෙන් ද,

(ඇ) A31 ප්‍රධාන නීති නිලධාරිනී (වැ. බ.) ගේ නිර්දේශය ''කළුතර ප්‍රදේශයේ නඩු කටයුතු වලදී ශ්‍රී ලංගමට වාසිදායී ලෙස නඩු කටයුතු පවත්වාගෙන යමින්, ශ්‍රී ලංගම නඩු කටයුතු වලදී පවරන කාර්යයන් දක්ෂ ලෙසත්, කාර්යක්ෂමවත්, අනලස්වත්, ඇපකැපවී ඉටුකරන කාර්යක්ෂම නිලධාරියකු වන ටී. එන්. ඒ. ප්‍රනාන්දු මහතාගේ සේවය දීර්ඝ කිරීම නිර්දේශ කොට ඉදිරිපත් කරමි. යනුවෙන් ද,

(ඈ) A34 ප්‍රධාන නීති නිලධාරිණියගේ නිර්දේශය ''ශ්‍රී ලංගමට එරෙහිව කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ හා ඊට යටත් ඩිපෝවල පවතින නඩු වලදී ශ්‍රී ලංගම වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටිමින් ශ්‍රී ලංගම වෙනුවෙන් විශ්වාසීව ඉතාම කාර්යක්ෂමව හා උනන්දුවෙන් නීතිඥ මහතුන් වෙත අවශ්‍ය සහයෝගය ලබාදෙමින් කටයුතු කරන නිලධාරි මහතකු වන ටී. එන්. ඒ. ප්‍රනාන්දු මහතාගේ සේවය දීර්ඝ කිරීම නිර්දේශ කරමි.'' යනුවෙන් ද නිර්දේශ ලබාදී ඇත.

ඉහත කී නිර්දේශයන් අනුව ඉහත කී A6 හෙවත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 52 චක්‍ර ලේඛයේ සඳහන් වන අවශ්‍යතාවන් ඉල්ලුම්කරු විසින් සපුරාගෙන ඇති බව පැහැදිලි වේ. තවද මෙම නිර්දේශ සිදුකර ඇත්තේ ඉල්ලුම්කරුගේ ආසන්නතම නිලධාරීන් මෙන්ම කළුතර දිස්ත්‍රික් කොට්ඨාසය භාර ප්‍රධාන නිලධාරියාද වේ. නිලධාරීන් කිහිප දෙනෙකු විසින්ම සේවකයාගේ කාර්යක්ෂමතාවය සහ ඉටුකරන කාර්යයන්හි ඇප කැපවීම සම්බන්ධයෙන් ඇගයීම් කර ඇති හෙයින් ඉල්ලුම්කරු මුල්වරට සේවා දිගුවක් ඉල්ලීමේදී ඔහුගේ කොට්ඨාශ ප්‍රධානියා කරන ලද ඇගයීම පක්ෂග්‍රාහීකත්වයෙන් තොර මෙන්ම සද්භාවයෙන් කළ ඇගයීමක් බවද තහවුරු වේ. මෙලෙස ඉහතින් ද සඳහන් කල පරිදි ඉල්ලුම්කරු විසින් චක්‍රලේඛවල ප්‍රතිපාදන සම්පූර්ණ කළ ද වගඋත්තරකරු විසින් ඔහුට සේවා දිගුවක් ලබා නොදී ඊට වඩා අඩු වාසි සහිත කොන්ත්‍රාත් පත්වීමක් පිරිනමා ඇත්තේ සේවා දිගුවක් ලබා නොදීමට හේතු වූ කරුණු දක්වීමක් ද නොකරමිනි. තවද වග උත්තරකරු විසින් ඉල්ලුම්කරුට සේවා දිගුවක් ලබා නොදී කොන්ත්‍රාත් පත්වීමක් පිරිනැමීමට හේතු පැහැදිලි කිරීමක් හෝ ඒ සම්බන්ධයෙන් කරුණු විමසීමක් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී ද සිදුකර නැත. ඒ අනුව කිසිදු නිශ්චිත හේතුවක් නොමැතිව වග උත්තරකරු විසින් ඉල්ලුම්කරුට සේවා දිගුවක් ලබා නොදීමෙන් ඉල්ලුම්කරුගේ අයිතිවාසිකම් යටපත් කර ඇති අතර ඒ හේතුවෙන් ඉල්ලුම්කරුට දැඩි අසාධාරණයක් සිදුව ඇති බව තීරණය කරමි.

4. මීලඟට සලකා බැලිය යුතු කරුණ වන්නේ සේවා දිගුවක් ලබාදීමේ බාධාවක් ලෙස සේවකයාගේ සෞඛ්‍ය තත්ත්වය සැලකිල්ලට ගත්තේ ද යන්නයි. එහෙත් ඒ පිළිබඳව කිසිදු තොරතුරක් සේවා යෝජක විසින් අනාවරණය කරගෙන නොමැති බැවින් එකී කරුණ ද සේවා දිගුවක් ලබා නොදීමට හේතුවක් වූ බව නොපෙනේ. එමෙන්ම ඉල්ලුම්කරු විශ්‍රාම යැවූ වග උත්තරකරු විසින්ම ඉන්පසු ඔහු වසර 05කට ආසන්න කාලයක් කොන්ත්‍රාත් පදනම මත අඛණ්ඩව සේවයේ යොදවා ඇති බැවින් ඉල්ලුම්කරු යහපත් සෞඛ්‍යය තත්ත්වයක සිටි බව තහවුරු වේ. මේ හැර සේවා දිගුවක් ලබා නොදීමේ වෙනත් හේතුවක් ද වග උත්තරකරු විසින් සේවකයාට දන්වා නොමැත. කෙසේ වුව ද ඉල්ලුම්කරුගේ ඉල්ලීම පරිදි සේවා දිගුවක් ලබා නොදීමට හේතු සාධක කිසිවක් වග උත්තරකරු විසින් සඳහන් නොකොට සේවා දිගුව වෙනුවට ඔහුට කොන්ත්‍රාත් පත්වීමක් පිරිනමමින් සේවා දිගුවක් ලබාගැනීමේ සේවකයාගේ අයිතිවාසිකම යටපත් කර ඇති බව පැහැදිලි වේ. වග උත්තරකරු විසින් ඉල්ලුම්කරුට සේවා දිගුවක් ලබා නොදී ඉල්ලුම්කරු ඉල්ලීමක් නොකළ කොන්ත්‍රාත් පත්වීමක් පිරිනැමීමෙන් වුවද පෙනී යන්නේ

ඉල්ලුම්කරුගේ සේවය තවදුරටත් ලබාගැනීමේ අවශ්‍යතාවය වගඋත්තරකරු වෙත පැවති බවයි. කෙසේ වුවද ඉල්ලුම්කරු විසින් ඉහත කී චක්‍රලේඛයේ ප්‍රතිපාදන සම්පූර්ණ කර ඇති හෙයින් ඉල්ලුම්කරුට සේවය ලබාදීම සම්බන්ධයෙන් වග උත්තරකරුට නීතිමය බාධාවක් නොමැති බව ද පෙනී යයි.

5. ඉහතින් ද සඳහන් කල පරිදි ඉල්ලුම්කරු දිවුරුම් ප්‍රකාශයක් මගින් සාක්ෂි ලබා දී ඇති අතර ඒ පිළිබඳව වග උත්තරකරු විසින් 2019.02.07 දින හරස් ප්‍රශ්න විමසීම සිදුකර ඇත. මෙකී සාක්ෂි විමසීමේදී වගඋත්තරකාර පාර්ශවය විසින් A6 ලේඛනය අනුව සේවකයකුට වයස අවුරුදු 57 දක්වා සේවා දිගුවක් ලබාදිය හැකි බව පිළිගෙන ඇත.

වග උත්තරකරු : මේ A6 කියන ලේඛනයෙන් තමයි ඔය 57 දක්වා සේවා දිගුව ලබාදීමට අදාළ රාජ්‍ය ව්‍යවස්ථාවේ කාර්ය මණ්ඩලයට හැකියාව ලබා දීලා තියෙන්නේ ? යනුවෙන් ප්‍රශ්න කිරීමේ දී

උත්තරය (ඉල්ලුම්කරු) : එහෙමයි යනුවෙන් පිළිතුරු දී ඇත. ඒ අනුව මෙකී චක්‍රලේඛයේ වයස අවුරුදු 57 දක්වා සේවය දීර්ඝ කිරීමට වග උත්තරකරුට ඇති හැකියාව සම්බන්ධයෙන් දෙපාර්ශවයම දැනුවත්ව සිටි බව පෙනී යයි. වගඋත්තරකාර පාර්ශවය විසින් තව දුරටත් ඉල්ලුම්කරුගේ හරස් ප්‍රශ්න විමසමින්

ප්‍රශ්නය : (වග උත්තරකරු) පාලක මණ්ඩලය අදහස් කරනවා නම් තමා ඔය සේවා දීර්ඝය ලබා දීමට හැකියාව තිබෙන්නේ ? යනුවෙන් සහ

ප්‍රශ්නය : (වග උත්තරකරු) පාලක මණ්ඩලයට එහෙම දෙනවාද නැද්ද කියලා තියෙන්නේ අභිමතයක් ? යනුවෙන් ද ප්‍රශ්න කර ඇත.

එහෙත් A6 චක්‍රලේඛය අනුව ඉල්ලුම්කරු සේවා දිගුවක් ඉල්ලා ඇත්තේ වයස අවුරුදු 55න් ඔබ්බට වේ. එකී චක්‍රලේඛය අනුව ඉල්ලුම්කරුට එම අවස්ථාවේ ඉහත කී පරිදි සේවකයාගේ කාර්යක්ෂමතාවය, සෞඛ්‍ය තත්ත්වය පැමිණීම ආදී කරුණු සලකා බලා සේවා දිගුවක් ලබාදිය හැක. ඉල්ලුම්කරු සම්බන්ධයෙන් එකී කරුණු තහවුරු නොවන්නේ නම් වග උත්තරකරුට ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැක. කෙසේ වුව ද වග උත්තරකාර පාර්ශවය සිය හරස් ප්‍රශ්න වලදී ප්‍රශ්න කරන ආකාරයේ ''පාලක මණ්ඩලයේ අදහස ''හෝ පාලක මණ්ඩලයේ ''අභිමතය'' යන කරුණුවල බලපෑමක් වයස අවුරුදු 55න් ඔබ්බට වයස අවුරුදු 57 දක්වා සේවා දිගුවක් ලබාදීමේ දී (ඉහත කී චක්‍ර ලේඛනයේ ප්‍රතිපාදන අනුව) ඇති නොවේ. එසේ වයස අවුරුදු 55න් ඔබ්බට සේවා දිගුවක් ලබාදීම කෙරේ පාලක මණ්ඩලයේ අභිමතය පාවිච්චි කලේ නම් එය චක්‍රලේඛයේ ප්‍රතිපාදන ඉක්මවා යාමක් ලෙස සැලකිය හැක. A6 චක්‍රලේඛය අනුව ඉල්ලුම්කරු සේවා දිගුවක් ඉල්ලා ඇත්තේ තමන්ට වයස අවුරුදු 55 පිරීමට මාස තුනකටත් පෙර ය. වග උත්තරකාර පාර්ශවය විසින් ඒ ගැන කිසිදු තැකීමක් නොකොට ඉහත කී පරිදි තමාගේ අභිමතය පාවිච්චි කරමින් ඉහත කී චක්‍රලේඛයේ ප්‍රතිපාදන ද නොසලකා හරිමින් ඉල්ලුම්කරු විශ්‍රාම යවා ඔහුට කොන්ත්‍රාත් පත්වීමක් පිරිනමා අනවධානයෙන්, හෝ නොසැලකිලිමත් කමින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම මගහැර ඇති බව පෙනී යයි.

6. තව ද එලෙස අයුක්ති සහගත මෙන්ම අසාධාරණ ලෙස ඉල්ලුම්කරුට සේවා දිගුවක් ලබා නොදීමෙන් ඉල්ලුම්කරුට ඉන්පසු ක්‍රියාත්මක වූ A7, A8 වශයෙන් මෙම නඩු විභාගයේ දී සලකුණු කර ඇති චක්‍රලේඛනවල ප්‍රතිපාදන ද අහිමි වී ඇති අතර, ඒ අනුව එකී ප්‍රතිලාභ නොලැබීමෙන් දැඩි අසාධාරණයක් සිදුවී ඇති බව පෙනී යයි. ඉල්ලුම්කරු මුල් වරට සේවා දිගුවක් ඉල්ලා ඇත්තේ විශ්‍රාම යාමට මාස තුනකටත් පෙරය. එම අවස්ථාවේ වග උත්තරකරු විසින් එකී ඉල්ලීම පරිදි සේවා දිගුවක් ලබා දුන්නේ නම්, පසු කාලයේ ක්‍රියාත්මක වූ A7 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති චක්‍ර ලේඛයේ ප්‍රතිපාදන පරිදි සේවා දිගුවක් ඉල්ලීමකින් තොරව වයස අවුරුදු 57 දක්වා සේවය කිරීමට ඉල්ලුම්කරුට ඉඩ ලැබෙනු ඇත. එමෙන්ම ඉන්පසු ක්‍රියාත්මක වූ A8 චක්‍රලේඛය මගින් සේවය දීර්ඝ කිරීමකින් තොරව වයස අවුරුදු 60 දක්වා සේවකයෙකුට සේවය කිරීමට අවස්ථාව සලසා ඇති හෙයින් එකි ප්‍රතිපාදන ද ලබා ගැනීමට ඉල්ලුම්කරුට අවස්ථාව තිබිණි. තව ද ඉල්ලුම්කරු විසින් මෙලෙස සේවකයාට සේවා දිගුවක් ලබා නොදීමට පැහැදිලි හේතුවක් සඳහන් නොකරමින් කොන්ත්‍රාත් පත්වීම පිරිනමා ඇත. එමෙන්ම වග උත්තරකරු විසින් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී ද සේවකයාට සේවා දිගුවක් ලබා නොදීමට කිසිදු හේතුවක් සඳහන් නොකරන අතර, ඒ පිළිබඳව හබ කිරීමක් සිදුකර නැත. එයින් පෙනී යන්නේ ඉහත කී චක්‍රලේඛවල ප්‍රතිපාදනද නොසලකා හරිමින් වග උත්තරකරු විසින් ඉල්ලුම්කරුට ලැබිය යුතු ප්‍රතිලාභ මගහරවමින් නිශ්චිත හේතුවක් නොමැතිව සේවා දිගුවක් ලබා නොදීමට ක්‍රියා කර ඇති බවයි.

7. මේ හැර වග උත්තරකරු විසින් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී දිගින් දිගටම ප්‍රශ්න කර සිටින්නේ ඉල්ලුම්කරු විසින් කොන්ත්‍රාත් පත්වීම සම්බන්ධයෙන් අභියාචනා නොකළ බවයි. කෙසේ වුවද මෙහිදී ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටින්නේ තමන්ට සේවා දිගුවක් ලබාදෙන මෙන් දිගින් දිගටම වග උත්තරකාර ආයතනය වෙත A14, මෙන්ම A27 සිට A34 දක්වා සලකුණු කොට දිවුරුම් ප්‍රකාශය සමග අමුණා ඉදිරිපත් කර ඇති ලිපි මගින් අභියාචනා කර ඇති බවයි. තවද එකී සෑම අවස්ථාවකම ආයතනය විසින් තමන්ට සේවා දිගුවක් වෙනුවට කොන්ත්‍රාත් පත්වීම් පිරිනමා ඇති බව වැඩිදුරටත් හරස් ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කරු විසින් ප්‍රකාශ කර ඇත. මෙකී ඉල්ලීම් අතර A14 මගින් කල ඉල්ලීම මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ ප්‍රාදේශීය කළමනාකාර විසින් ඉල්ලුම්කරුගේ සේවය ආයතනයට අවශ්‍ය බව පවසමින් සහ ඉල්ලුම්කරු කාර්යශූර නිලධාරියකු බව සඳහන් කරමින් ඔහුගේ සේවය දීර්ඝ කරදෙන මෙන් මුල්ම අවස්ථාවේ තම නිර්දේශය (සලකුණු කර ඉදිරිපත් කර ඇති A15 ලේඛනය මගින්) අවශ්‍ය කටයුතු සඳහා වග උත්තරකාර ආයතනයේ ඉහල නිලධාරීන්ට යවා ඇත. එහෙත් තමන්ට එම අවස්ථාවේ කිසිදු හේතුවක් නොමැතිව වග උත්තරකාර ආයතනය විසින් සේවා දිගුව වෙනුවට කොන්ත්‍රාත් පත්වීමක් පිරිනැමීමෙන් වග උත්තරකාර ආයතනය විසින් තමන්ට පළමු වැරැද්ද සිදුකර ඇති බව ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටී. 2019.02.07 සාක්ෂි විමසීම පිටු අංක 25 අනුව.

ප්‍රශ්නය : ඊට පස්සේ තමුන් ඉල්ලීමක් කළාද තමන්ගේ සේවය දීර්ඝ කරන්න කියලා කොන්ත්‍රාත් පදනමේ ඉද්දී ?

පිළිතුර : ඉල්ලීමක් කළා ....යනුවෙන් දීර්ඝ විස්තරයක් කරමින් තමන් සේවා දිගුවක් ඉල්ලූ බවත්, තමන් විශ්‍රාම ගැන්වීමටත් පෙර සිටම එකී ඉල්ලීම වෙනුවට කොන්ත්‍රාත් පදනමින් පත්වීම් ලිපියක් නිකුත් කල බවත් එය වග උත්තරකරු විසින් තමන්ට කල පළමු වරද බවත් කියා සිටී.

ඉල්ලුම්කරු සිය දිවුරුම් ප්‍රකාශයෙන් 17 ඡේදයේ දක්වා ඇති කරුණු සහ එකී ඡේදය යටතේ සලකුණු කොට ඉදිරිපත් කර ඇති ලේඛන අනුව ද පහත කරුණු අනාවරණය වේ. එනම් ඉල්ලුම්කරුට 2011.03.21 දිනැතිව කොන්ත්‍රාත් පත්වීමක් නිකුත් කිරීමෙන් පසුව ඉල්ලුම්කරුට සිදුවූ අයුක්තිය සහ අසාධාරණය සම්බන්ධයෙන් ඔහු විසින් තමන්ට සේවා දිගුවක් ලබාදෙන මෙන් වරින්වර වග උත්තරකාර ආයතනය වෙත අභියාචනාවන් ඉදිරිපත් කර ඇති බවත් ඒ අනුව ඉහතින් ද සඳහන් කල පරිදි ඉල්ලුම්කරුගේ ආසන්නතම ප්‍රධානියා වන ප්‍රාදේශීය කළමනාකරු ඉල්ලුම්කරුගේ සේවය අගය කරමින් ඔහුට සේවා දිගුවක් ලබාදෙන ලෙස A15 ලේඛනය මගින් නිර්දේශ කර ඇති බවත් ඉ්ල්ලුම්කරු ප්‍රකාශ කර ඇත. A15 ලේඛනය මගින් 2011.02.07 දින සේවකයා විශ්‍රාම ගැන්වීමට පෙර ද, A27 ලේඛනය මගින් 2012.11.20 දින ඉල්ලුම්කරුගේ අභියාචනය මත සටහනක් යොදමින් ද, A28 ලේඛණයෙහි 2013.03.11 දින ඉල්ලුම්කරු ඉදිරිපත්කර ඇති අභියාචනය මත ''මොහු විසින් ඉටුකරන කාර්ය භාරය සලකා බලා මොහුගේ සේවය වයස 60 දක්වා දීර්ඝ කිරීම නිර්දේශ කරමි.'' යනුවෙන් සටහන් තබමින් ද ඉල්ලුම්කරුගේ අභියාචනා මත ඔහුට සේවා දිගුවක් ලබා දීම ප්‍රාදේශීය කළමනාකරු විසින් නිර්දේශ කර ඇති බව ඉල්ලුම්කරු සිය දිවුරුම් ප්‍රකාශය මගින් සාක්ෂි ලබා දෙමින් සලකුණු කර ඇති ලේඛන අනුව පැහැදිලි වේ.

මීට අමතරව 2015.04.08 දිනැතිව ප්‍රාදේශීය කළමනාකරු විසින් ඉල්ලුම්කරුට සේවා දිගුවක් ලබාදෙන මෙන් කරුණු දක්වා මානව සම්පත් කළමනාකාර වෙත යැවූ ලිපියක ද ඉල්ලුම්කරු විසින් A33 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එකී ලේඛනය මගින් ද සේවකයාගේ සේවය ඇගයීමක් සිදුකර ඇති අතර ඉල්ලුම්කරුගේ ශ්‍රේණියට අදාළ වැටුප් නොලැබීමෙන් අසාධාරණයක් සිදුවන බවට තමන් වෙත අභියාචනා කර ඇති බව දක්වා ඇත. එමෙන්ම අදාළ ශ්‍රේණියේ වැටුප් තලයේ පිහිටුවා ඉල්ලුම්කරුගේ සේවය දීර්ඝ කිරීම සුදුසු බව ද නිර්දේශ කර ඇත. ඉල්ලුම්කරුගේ ඉහල නිලධාරීන්ගේ මෙකී නිර්දේශයන්හි පැහැදිලිව දක්වා ඇත්තේ කොන්ත්‍රාත් පදනමින් සේවය දීමෙන් ඉල්ලුම්කරුට අඩු වැටුපක් ලැබීමේ අසාධාරණයක් ද සිදුව ඇති බවයි. එසේ වුව ද වග උත්තරකරු විසින් කිසිදු හේතුවක් නොදක්වා කොන්ත්‍රාත් පත්වීම දිගටම පවත්වාගෙන ගොස් ඇති අතර එයින් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුව ඇති බව නිගමනය කරමි.

තවද ඉල්ලුම්කරු නීති අංශයේ සේවය කර ඇති අතර ඔහුගේ ආසන්නතම ප්‍රධානීන් වන නීති නිලධාරීන් විසින් ද මොහුගේ සේවය අගය කරමින් ඔහුට සේවා දිගුවක් ලබාදෙන මෙන් ඔහු විසින් කරන ලද අභියාචනා මත සටහන් තබා නිර්දේශ කර ඇත. ඒ බව ඉල්ලුම්කරු විසින් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ 17 ඡේදය යටතේ සඳහන් කර ඉදිරිපත් කර ඇති A31, A34 යන ලේඛනවලින් පැහැදිලි වේ. මේ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම සේවා දිගුවක් බව ඔහුගේ අංශ ප්‍රධානීන් වටහාගෙන එකී නිර්දේශයන් කල බව පැහැදිලි වන අතර ඔවුන් විසින් ද ඉල්ලුම්කරුට සේවා දිගුවක් ලබාදීම නිර්දේශ කර ඇත. කෙසේ වුව ද එම අවස්ථාවේ එකී නිර්දේශයන් නොසලකා හරිමින් ඉල්ලුම්කරුට සේවා දිගුවක් ලබාදීම වෙනුවට A27 සහ A46 දක්වා කොන්ත්‍රාත් පත්වීම් ලබාදීමෙන් වග උත්තරකරු විසින් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුකර ඇති බව ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටී.

ඉහතින් ද සඳහන් කල පරිදි ඉල්ලුම්කරු විසින් රාජ්‍ය සේවා චක්‍රලේඛවලට අනුකූලව දිගින් දිගටම සේවා දිගුවක් ඉල්ලා සිටීමෙන් පෙනී යන්නේ සේවය දීර්ඝ කිරීමට අදාළව අභියාචනා කර ඇති බවයි. එමෙන්ම වග උත්තරකරුවන් පිරිනමන ලද කොන්ත්‍රාත් පත්වීම සම්බන්ධයෙන් තෘප්තිමත් නොවූ බව ද සේවා දීර්ඝයක් සම්බන්ධයෙන් දිගින් දිගටම ඉල්ලීම් කිරීමෙන් පෙනී යයි. මේ අනුව සේවකයා විසින් සේවා දීර්ඝය සම්බන්ධයෙන් තම ඉල්ලීම දිගින් දිගටම සිදුකර ඇති අතර එමගින් තමන්ට ලබා දී ඇති කොන්ත්‍රාත් පත්වීම සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවූ බව පැහැදිලි වේ. කෙසේ වුව ද ඉල්ලුම්කරුට සේවා දිගුවක් ලබාදීමේ හැකියාව තිබුණ ද වග උත්තරකරු විසින් එකී අයිතිය යටපත් කර ඒ වෙනුවට අඩු වාසිදායක කොන්ත්‍රාත් පත්වීමක් ලබාදී ඇති අතර, එසේ කිරීමට හේතු කවරේද යන්න කොන්ත්‍රාත් පත්වීමක් පිරිනැමීමේදී හෝ ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී වග උත්තරකරු විසින් තහවුරු කර නැත. මේ අනුව වග උත්තරකරුගේ එකී ක්‍රියා කලාපය මගින් ඉල්ලුම්කරුට අගතියක් මෙන්ම අසාධාරණයක් සිදුව ඇති බව නිගමනය කරමි.

8. මේ හැර ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශයෙන් 16 ඡේදයේ දැක්වෙන්නේ තමන්ට A16 මගින් කොන්ත්‍රාත් පත්වීමක් ලබා දුන්නද තමන්ට පැවරූ කාර්යයන්හි කිසිදු වෙනසක් සිදුකර නොමැති බවයි. එනම් A3, A4, A5 මගින් තමන්ට පැවරූ රාජකාරිවල කිසිදු වෙනසක් සිදුකර නොමැති බවයි. වග උත්තරකරු වෙනුවෙන් නීතිමය කටයුතු කිරීමට පැවරූ ලිපිවල පිටපත් A18 සිට A26 දක්වා සලකුණු කර ඉදිරිපත් කරමින් ඔහු මේ බව ප්‍රකාශ කර සිටී. එකී ලිපි ලේඛන මගින් ඉල්ලුම්කරුට උසාවි සහ වෙනත් නීතිමය ආයතනවල නීති කටයුතු පැවරීමක් සිදුකර ඇත. මේ අනුව පෙනී යන්නේ ඉල්ලුම්කරුට කොන්ත්‍රාත් පත්වීමක් ලබා දුන්න ද ඔහු ස්ථිර සේවකයකු ලෙස ආයතනයට සිදුකල සේවයේ කිසිදු වෙනසක් සිදුකර නොමැති අතර එකී සේවය එලෙසම පවත්වාගෙන ගිය බවයි. වග උත්තරකරු විසින් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසුව ද කොන්ත්‍රාත් පත්වීමක් ලැබූවෙකු ලෙස ඔහුගේ සේවා තත්ත්වයේ වෙනසක් සිදුවීද යන්න සම්බන්ධයෙන් කරුණු විමසීමක් හෝ හබ කිරීමක් ද සිදුකර නොමැත. එමෙන්ම කොන්ත්‍රාත් පත්වීමක් ලබා දීමේදී ඉල්ලුම්කරුට ලබා දී ඇති ලේඛණයෙහි සඳහන් වන්නේ ඉල්ලුම්කරුගේ සේවය යම් කාලයක් සඳහා දීර්ඝ කරන බවක් පමණි. සිදුකරන ලද කටයුතුවල කිසිදු වෙනසක් එකී ලිපි මගින් හෝ සිදුකර නැත. මේ. අනුව පෙනී යන්නේ ඉල්ලුම්කරුට කොන්ත්‍රාත් පත්වීමක් ලබා දුන්න ද පෙර සිටි සේවා තත්ත්වයෙන්ම පෙර නියැලි සිටි කටයුතුවලට යොදා ගැනීමට වග උත්තරකරු විසින් කටයුතු කර ඇති බවයි. එසේ වුව ද කොන්ත්‍රාත් පත්වීමක් ලබාදීම නිසා ඉල්ලුම්කරුට ලැබිය යුතු වැටුප් වැඩිවීම් කිසිවක් ලැබී නොමැති බවට ඉල්ලුම්කරු මෙම නඩුවේදී හබකර සිටී. ඊට අමතරව A47 සහ A48 ලේඛන සලකුණු කර ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශ කර සිටින්නේ 2011 වර්ෂයේ නියමිත වැටුප් ද, 2012 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා ගෙවන ලද වැටුපෙන් කොටසක් ද වග උත්තරකරු විසින් ආපසු අයකරගෙන ඇති බවයි. මේ හැර ඉල්ලුම්කරු විසින් තමන් වෙනුවෙන් සාක්ෂි දීම සඳහා වග උත්තරකාර ආයතනයේ සේවය කරනු ලබන කළමනාකරු

කොට්ඨාසයේ වේතන ලිපිකරු කැඳවා ඉල්ලුම්කරුට වැටුප් ගෙවීම සම්බන්ධයෙන් සාක්ෂි විමසා ඇත. එකී සාක්ෂිකරුගේ 2019.06.11 දින සාක්ෂිය අනුව.

ප්‍රශ්නය : දැන් මේ ඒ 5 ලේඛනය අනුව 2009.01.27 වැනි දින සිට වසර 08ක් යනතුරු ඉල්ලුම්කරුට රු. 130/- බැගින් වැටුප් වර්ධක ලබාදිය යුතු යි ද ?

පිළිතුර : ලබාදිය යුතුයි සේවා කාලය අනුව

ප්‍රශ්නය : දැන් බලන්න 2009.01.27 දින සිට වැටුප් වර්ධක වසර කීයක් ගෙවලා තියෙවා ද කියලා ?

පිළිතුර : අවුරුදු දෙකක් ගෙවලා තියෙනවා

ප්‍රශ්නය : දැන් එතකොට 2012, 2013, 2014, 2015, 2016 වර්ෂවල මේ වැටුප් වර්ධක ලබාදීලා නැහැ ?

පිළිතුර : නැහැ.

ප්‍රශ්නය : නමුත් 2011, 2012, 2013, 2014, 2015 යන වර්ෂවල මෙම ඉල්ලුම්කරු සේවය කරලා තියෙනවා ද ?

පිළිතුර : 2011.04.27 වැනි දින විශ්‍රාම ගැන්වීමෙන් පසු කොන්ත්‍රාත් පදනම මත සේවය කරලා තියෙනවා.

(ඉල්ලුම්කරුට 2011 සිට 2015 දක්වා වැටුප් ගෙවීම් පිළිබඳව පිළිවෙලින් A50 සිට A54 දක්වා ලේඛන සලකුණුකර ඉදිරිපත් කරමින් මෙකී සාක්ෂිය ලබා දී ඇත)

ඉහත කී සාක්ෂිකරු වැඩි දුරටත් සාක්ෂි දෙමින් රජය මගින් වරින්වර නිකුත්කල A60 සිට A66 දක්වා චක්‍රලේඛ ඉදිරිපත් කරමින්ද ප්‍රකාශ කර සිටින්නේ එම චක්‍රලේඛවලින් වැඩිවූ වැටුප් සහ දීමනාවන් ගෙන් A63හි දක්වා ඇති ප්‍රතිලාභ හැර අනෙකුත් කිසිදු ප්‍රතිලාභයක් ඉල්ලුම්කරුට ලබාදී නොමැති බවයි.

මේ හැර 2019.07.25 දින ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මුදල් කළමනාකාර විසින් සාක්ෂි ලබාදුන් අතර, 2012 සිට 2016 දක්වා ක්‍රියාත්මක වූ චක්‍රලේඛ අනුව වග උත්තරකාර ආයතනයේ අනෙකුත් සේවයන්ට එකී චක්‍රලේඛ අනුව වැටුප් වැඩිවීමක් සිදුවූ බවත් ඉල්ලුම්කරුට වැටුප් වැඩිවීම් ලබාදී නොමැති බවත් ප්‍රකාශ කර ඇත. එයට හේතු වශයෙන් දක්වා ඇත්තේ මෙම ඉල්ලුම්කරු එකී කාලය තුළ කොන්ත්‍රාත් පදනම මත සේවය කළ බැවින් මෙම වැටුප් වැඩිවීම් අදළ නොවන බවයි.

කෙසේ වුව ද ඉල්ලුම්කරුට කොන්ත්‍රාත් පදනම මත සේවය ලබා දුන්න ද මුලින් සිදුකල සේවයම තවදුරටත් අඛණ්ඩව කරගෙන යාමට සලසමින් මුල් සේවා තත්ත්වයන්ට අදළ වැටුප් සහ දීමනාවන්හි ප්‍රතිලාභ ලබා නොදෙමින් අඩු වැටුප් තලයකට යටත්ව ඉල්ලුම්කරුගේ සේවය ලබා ගැනීම වග උත්තරකරු විසින් සිදුකර ඇති බව සාක්ෂි මගින් තහවුරු වේ. මේ අනුව නාමික වශයෙන් වරින්වර කොන්ත්‍රාත් තනතුරක් ලෙස ලිපි මගින් ඉල්ලුම්කරුගේ සේවය නම් කලද, සැබැවින්ම කල සේවා කටයුතුවලදී කොන්ත්‍රාත් ගිවිසුමක පරිදි සේවා බණ්ධනයක් හෝ සේවා කටයුතුවල හෝ සේවා තත්ත්වයන්හි සැබෑ වෙනසක් සිදුව නොමැත. එමෙන්ම සේවා කටයුතු සිදු කිරීමේදී සේවකයාගේ නොසැලකිලිමත් බවත් හෝ අකාර්යක්ෂමතාවයක් තහවුරු වී නොමැති අතර සාක්ෂි මගින් තහවුරු වන පරිදි ඉල්ලුම්කරුගේ ආසන්නතම ප්‍රධානීන් විසින් ඔහුගේ සේවය අගයීමකටද ලක්කර ඇත. එබැවින් එකී සේවාවට අදළ වූ වැටුප් වැඩිවීම් සහ වැටුප් වර්ධක ලබා නොදීමෙන් වග උත්තරකරු විසින් සේවක අයිතීන් යටපත් කිරීමෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුව ඇති බව නිගමනය කරමි.

9. මේ හැර ඉල්ලුම්කරු විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ III වන ශ්‍රේණියේ ප්‍රාදේශීය කළමනාකාර වශයෙන් මාණ්ඩලික ශ්‍රේණියේ සේවය කළ නිලධාරියකු 2019.08.22 දින සාක්ෂියකට කැඳවා ඇති අතර ඔහු සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත්තේ 2010.07.10 දින A67 ලිපිය මගින් තමන් විශ්‍රාම ගන්වා ඇති බවත් ඊට මාස තුනකට පෙර තමන් සේවා දිගුවක් ඉල්ලා සිටි අතර ඒ අනුව A68 ලිපිය මගින් තමන්ට අඛණ්ඩ සේවා දිගුවක් ලබා දී ඇති බවත් ය.

ප්‍රශ්නය : දැන් ඔබ A67 දරන ලිපියෙන් තමාව විශ්‍රාම යැවුවාම A68 දරන ලිපියෙන් නැවත විශ්‍රාම ගන්වනවා යයි කියන දින සිටම තමන් සේවයේ යොදවා තියනවා නේද ?

පිළිතුර : සේවයේ යෙදවීමක් කළා.

ප්‍රශ්නය : දැන් ඔය සේවා දීර්ඝය කොන්ත්‍රාත් පදනම යටතේ දීපු එකක් ද ? නැතිනම් අඛණ්ඩ සේවා දීර්ඝයක් හැටියට ද දීලා තියෙන්නේ ? යනුවෙන් විමසීමේ දී

පිළිතුර : අඛණ්ඩ සේවාවක් හැටියට දීලා තියෙන්නේ යනුවෙන් පවසා ඇත.

මේ අනුව එකී නිලධාරියා විශ්‍රාම ගැනීමෙන් පසු ඔහුගේ ඉල්ලීම මත සේවා දිගුවක් ලබා දී ඇති බව සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව පැහැදිලි වේ. එසේ වුවද ඔහු මෙන්ම මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු වන ඉල්ලුම්කරු ද 2011.04.28 දින විශ්‍රාම යැවීමට මාස තුනකට පෙර සේවා දිගුවක් ඉල්ලා සිටිය ද වග උත්තරකරු විසින් ඔහුට ලබා දී ඇත්තේ සේවා දිගුව වෙනුවට කොන්ත්‍රාත් පත්වීමකි. මේ අනුව මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් වන ඉහත සාක්ෂිකරුට සහ මෙම නඩුවේ ඉල්ලුම්කරුට වග උත්තරකාර ආයතනය සේවා දිගුවක් ඉල්ලීමේදී දෙයාකාරයකට කටයුතු කර ඇති බව පැහැදිලි වේ. ඒ අනුව වග උත්තරකරු විසින් යුක්ති සහගත හෝ සාධාරණ හේතුවක් නොමැතිව එලෙස කටයුතු කිරීමෙන් ඉල්ලුම්කරුට සේවා දිගුවක් ඉල්ලීමේදී කොන්ත්‍රාත් පත්වීමක් ලබාදීමෙන් අසාධාරණයක් සිදුව ඇති බව නිගමනය කරමි. එමෙන්ම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවල ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම මිස ඒ පිළිබඳව අර්ථකතන ලබාදීම හෝ තම අභිමතය පරිදි කටයුතු කිරීමේ බලයක් එකී චක්‍රලේඛ ක්‍රියාත්මක කරන නිලධාරීන් සතුව නොමැති බව ද සඳහන් කරමි.

ප්‍රදානය :

ඉල්ලුම්කාර පාර්ශනය සහ වග උත්තරකාර පාර්ශවයේ පළමු සහ දෙවන ප්‍රකාශයන් ද දිවුරුම් ප්‍රකාශ සහ ඉදිරිපත් කර ඇති

ලිඛිත සහ වාචික සාක්ෂි මෙන්ම ලිඛිත දේශන ද සැලකිල්ලට ගෙන පහත ප්‍රදනය කරමි.

1. ඉහතින් ද සඳහන් කල පරිදි ඉල්ලුම්කාර පාර්ශවය විසින් රාජ්‍ය චක්‍රලේඛවල ප්‍රතිපාදන ද සැලකිල්ලට ගනිමින් නියමිත කාලය තුළ සේවා දීර්ඝයක් ඉල්ලා සිටියදී වග උත්තරකාර පාර්ශය කිසිදු නිශ්චිත හේතුවක් නොදක්වා සේවා දිගුව වෙනුවටෙ කොන්ත්‍රාත් පත්වීමක් ලබාදීමෙන් දෙපාර්ශවය අතර මෙම ආරවුල පැන නැගී ඇත.

2. වරින්වර පනවන ලද රාජ්‍ය චක්‍රලේඛ මගින් සේවකයකුට වයම අවුරුදු 55 ඉක්ම වූ පසු සේවා දිගුවක් ලබාදීමට අවශ්‍ය විධිවිධාන සලසා ඇති අතර සේවකයකු විසින් තමන් විශ්‍රාම යාමට මාස තුනකට පෙර ඒ සඳහා ඉල්ලුම් කල යුතු වේ. ඒ අනුව සේවා අවශ්‍යතාවය, සේවකයාගේ කාර්යක්ෂමතාවය සහ සෞඛ්‍ය තත්ත්වය යනාදී කරුණු සලකා බලා සේවකයාට සේවා දිගුවන් ලබාදීමට හැකිය යනුවෙන් එකී චක්‍රලේඛවල සඳහන්ව ඇත. මෙම නඩුවේ ඉල්ලුම්කරු ද එකී චක්‍රලේඛවල ප්‍රතිපාදන පරිදි සේවා දිගුවක් ලබා ගැනීම සඳහා නියමිත කාලය තුළ ඉල්ලීම් කර ඇති අතර ඉල්ලුම්කරුට සේවා දිගුවක් ලබා නොදීමටත් සහ සේවා දිගුව වෙනුවට කොන්ත්‍රාත් පත්වීමක් ලබාදීමටත් වග උත්තරකරු විසින් කටයුතු කර ඇති බව ඉල්ලුම්කරුගේ සාක්ෂියේදී පැහැදිලි වේ. කෙසේ වුවද එලෙස සේවා දිගුවක් ලබා නොදීමට ඉල්ලුම්කරුට ඇති නොහැකියාවන් හෝ වෙනත් නිශ්චිත හේතුවක් වග උත්තරකරු විසින් ඉල්ලුම්කරුට පෙන්වා දී නොමැති අතර මෙම නඩු විභාගයේ දී ද ඒ පිළිබඳව කිසිඳු සඳහන් කිරීමක් හෝ හබකිරීමක් වග උත්තරකරු විසින් සිදුකර නොමැත. මේ අනුව ඉල්ලුම්කරුට සේවා දිගුවක් ලබාදීමේ නීතිමය බාධාවක් නොමැති බව නිගමනය කරමි.

කෙසේ වුවද ඉල්ලුම්කරුගේ සාක්ෂියෙන් වැඩිදුරටත් පැහැදිලි වන්නේ විශ්‍රාම යැවූ දිනයේ සිටම සේවා දිගුවක් ලබාදෙන මෙන් ඉල්ලුම්කරු විසින් අභියාචනා ඉදිරිපත් කළ ද වග උත්තරකරු විසින් එකී ඉල්ලීම් සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා වරින්වර කොන්ත්‍රාත් පත්වීම් ලබාදෙමින් මුල් සේවා තත්ත්වයෙන්ම අඛණ්ඩව ඉල්ලුම්කරුගෙන් සේවය ලබාගත් බවත් ය. එසේ සේවය ලබා ගත්ත ද ඉල්ලුම්කරුට වැටුපට අදළ දීමනා සහ වැටුප් වර්ධන පවා අහිමිව ඇති බව වග උත්තරකරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. මෙලෙස කොන්ත්‍රාත් පත්වීමක් ලබාදීමෙන් සේවකයාට සේවා දිගුවක් ලැබීමේ අයිතිය යටපත්ව ඇති අතර ඉහත කී චක්‍රලේඛ අනුව ලැබිය යුතු දීමනා ද අහිමිව ඇති බැවින් එමගින් සේවකයාට අසාධාරණයක් සිදුව ඇති බව නිගමනය කරමි.

එමෙන්ම ඉල්ලුම්කරු කොන්ත්‍රාත් පදනම මත සේවය යෙදවුවද සේවා තත්ත්වයන්හි කිසිදු වෙනසක් සිදු නොකොට විශ්‍රාම යැවීමට පෙර සිට සේවා තත්ත්වයෙන් අඛණ්ඩව වසර පහක පමණ කාලයක් සේවාවක් ලබාගෙන ඇති බවද සාක්ෂි මත තහවුරු වේ. මේ අනුව ලිඛිතව සේවා දිගුවක් ලබා නොදුන්න ද මුලින් සිටි සේවා තත්ත්වයෙහිම දීර්ඝ කාලයක් අඛණ්ඩව සේවය ලබා ගැනීමෙන් වග උත්තරකාර ආයතනය සිය සේවා අවශ්‍යතාවය සම්පූර්ණ කර ගෙන ඇති අතර ඉල්ලුම්කරු විසින් මුලින් සිදු කළ සේවා කටයුතු ආවරණය කර ගැනීමට ද වෙනත් පුද්ගලයෙකු යොදවා ගෙන නොමැති බැවින් ද, එකී සේවා කටයුතුවල පූර්ණකාලීනව මෙම ඉල්ලුම්කරු සේවයේ යොදවාගෙන ඇති බව තහවුරු වේ. මේ අනුව ඉල්ලුම්කරුට ලිඛිතව කොන්ත්‍රාත් පත්වීමක් ලබා දුන්න ද සේවය ලබා ගැනීමේදී කොන්ත්‍රාත් පත්වීමක ස්වරූප අනුගමනය නොකළ බවත් දීර්ඝ කාලීන අඛණ්ඩ සේවයක් ලබාගෙන ඇති බවත් නිගමනය කරමි.

තවද ඉල්ලුම්කරුගේ සේවාව අගය කරමින් ඔහුගේ ඉහල නිලධාරීන් කිහිප දෙනෙකු විසින්ම සේවා දිගුවක් ලබාදීම නිර්දේශ කර ඇත. එමෙන්ම ඉල්ලුම්කරු විශ්‍රාම ගැන්වීමෙන් පසු කිසිදු බාධාවකින් තොරව වසර පහක පමණ කාලයක් සේවය කිරීමෙන්ද පෙනී යන්නේ ඉල්ලුම්කරුට ද සෞඛ්‍ය හෝ වෙනත් හේතුවක් මත වැඩි දුරටත් සේවය කිරීමේ නොහැකියාවක් ද නොපැවති බවයි. එසේ තිබියදී සේවා දිගුවක් ලබා නොදීම කිසිදු හේතුවක් නොදක්වා ඉල්ලුම්කරුට කොන්ත්‍රාත් පත්වීමක් ලබාදීමෙන් ඉල්ලුම්කරුට සේවා දිගුවක් ලබා ගැනීමේ අයිතිය වග උත්තරකරුගේ විසින් යටපත්කර ඇති බවත් වග උත්තරකරුගේ එකී ක්‍රියා කලාපය සාධාරණ නොවන බව නිගමනය කරමි.

ඉල්ලුම්කරු 2011 අප්‍රේල් මස සිට 2015 ඔක්තෝබර් දක්වා නොකඩවා සේවයේ යෙදූ කාලය සම්බන්ධයෙන් ඉහතින් සඳහන් කල පරිදි ඔහු ස්ථිර සේවකයෙකු ලෙස ක්‍රියාකාරීව කටයුතු කර ඇති හෙයින් වරින්වර ලිඛිතව කොන්ත්‍රාත් පදනම යටතේ ලබාදී ඇති පත්වීම් බලාත්මක වී නොමැති බව නිගමනය කරමි. ඒ අනුව එකී සේවා කාලය සම්බන්ධයෙන් රාජ්‍ය චක්‍රලේඛන අනුව ඉල්ලුම්කරුට ලැබිය යුතු වැටුප් සහ දීමනා ගෙවීම් සාධාරණ බව නිගමනය කරමි. ඒ අනුව ඉල්ලුම්කරු විසින් සිය දිවුරුම් ප්‍රකාශය සමග ඉදිරිපත් කර ඇති A49 ලේඛනයේ සඳහන් පරිදි රාජ්‍ය සේවා චක්‍රලේඛවලට අනුකූලව වැඩිවී ඇති (එහෙත් ඉල්ලුම්කරුට මෙතෙක් ගෙවා නොමැති) වැටුප් සහ දීමනා ගෙවීම් සාධාරණ බව නිගමනය කරමි. ඒ අනුව 2011 ජූලි මස සිට 2015 ඔක්තෝබර් දක්වා ලැබිය යුතු එහෙත් මෙතෙක් නොගෙවා ඇති වැටුප් වර්ධක සහ දීමනාවල එකතුව වශයෙන් රුපියල් හාරලක්ෂ පනස් නව දහස් හයසිය හැත්තෑ හයයි ශත දහ නවයක (රු. 4,59,676.19) මුදල ඉල්ලුම්කරුට ගෙවන මෙන් වග උත්තරකරුට නියෝග කරමි. (ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති A49 ලේඛනයට අනුව මෙකී කාලය සඳහා ඉහත කී මුදල් ප්‍රමාණය ගණනය කර ඇත).

03. මෙම ප්‍රධානය *ගැසට්* පත්‍රයේ පළවී මාස 02ක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු ය. ඉහත කී හිඟ වැටුප් සහ දීමනා මුදල ඉල්ලුම්කරුට ගෙවීම පිණිස මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැම්පත් කළ යුතු ය.

04. වග උත්තකරු විසින් රාජ්‍ය චක්‍රලේඛනවල ප්‍රතිපාදන සැලකිල්ලට නොගනිමින් ඉල්ලුම්කරුට සේවා දීර්ඝයක් ලබා නොදී අඛණ්ඩව මුල් සේවා තත්ත්වයෙන්ම සේවය ලබා ගැනීමත්, එසේ වුවද ඒ අනුව ඉල්ලුම්කරුට හිමිවිය යුතු වැටුප් වර්ධන සහ දීමනා ලබා නොදීමෙන් ඉල්ලුම්කරුට අසාධාරණයන් සිදුව ඇති බැවින් ඉහත සඳහන් ප්‍රදනය කිරීම යුක්ති සහගත සහ සාධාරණ බව ප්‍රකාශ කරමි.

**එච්. එම්. අනුලාවතී,**
බේරුම්කරු.

2020 අගෝස්තු මස 12 වැනි දින.

10 - 939

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.